කොටස් පහකින් සමන්විත "ආසියාතික බෞද්ධ ස්ත්‍රියක් හමුවේ ඩෙරිඩාව විසංයෝජනය කල විට..." නම් කෘතියේ දෙවන කොටස
(මෙහි පළමු කොටස ප්‍රවාද 8 වන කලාපයේ පළවිය.)

# ආසියාතික
# බෞද්ධ ස්ත්‍රියක් හමුවේ ඩෙරිඩාව
# විසංයෝජනය කළ විට....

මෙම
කෘතිය
මවන
ප්‍රතිභා
චිත්‍රය
අනෙකෙක්

සුවත්
මෙම කෘතියේ
සියුම්
විද්‍යාත්ම
ජීවයන්
සහා භවට

I. ස්ත්‍රියකගේ ආවේණික භාවිතයේ විසංයෝජනය
II. ස්ත්‍රී – පාරභෞතිකවාදය
III. ඩෙරිඩාගේ අවාසනාව
IV. ආසියාතික / බටහිර විවිධත්වය
V. බෞද්ධ ජීවන භාවිතය හා යේල් විශ්ව විද්‍යාලයේ භාවිතය

රොහාන් පෙරේරා

# II. ස්ත්‍රී - පාරභෞතිකවාදය

## පාරභෞතිකවාදය

මෙ හැම සිතුවිල්ලකට පවතින්න පුළුවන් ඊළඟට එන සිතුවිල්ලත් එක්ක සම්බන්ධවීමෙන්; අඛණ්ඩ වීමෙන්. ඒ කියන්නේ "මොනවා" හෝ සම්බන්ධයක් ඇති කර ගැනීමෙන්. අනික සිතුවිලි නිකුත් වෙන්නේ ශාරීරික, චින්තන, කථා..... භාවිතයෙන්. නිදසුනකට අතක් හෙල්ලුවම සිතුවිල්ලක් එනවා. ඒ සිතුවිල්ල ගැන කථා කළාම තව සිතුවිල්ලක් එනවා. ඒ සිතුවිල්ල ඊළඟ දවසේ වැඩක් එක්ක සම්බන්ධ වෙනවා. මේ සම්බන්ධ කිරීමේ චින්තන භාවිතයේ දී තවත් සිතුවිල්ලක් එනවා.... යනාදී වශයෙන්. තමන්ගේ භාවිතයේ හරි වැරැද්ද මත, හරි භාවිතයට භෞතික සිතුවිලිත්, වැරදි භාවිතයට විඥාන සිතුවිලිත් නිකුත් වෙනවා කියලා අදහන සම්ප්‍රදයක් තියෙනවා. මේක විකාරයක්. මොකද "හරි වැරදි" මනින්නේත් තමන්මයි. ඉතිං, හැමෝම භෞතික සිතුවිලි ඇති අය වෙනවා. නමුත් ව්‍යුහයන් වෙනස් කරන භාවිතය (ශාරීරික, චින්තන, කථා,........) නිසා මතුවන සිතුවිලි හැම වෙලේම භෞතිකයි. මෙහෙම වෙන්නේ ව්‍යුහයන් භෞතික නිසයි. මේ නිර්ණයේදී ත් මිනිස් දුර්වලතා දෙකකට ඉඩ තියෙනවා. ව්‍යුහයක් නොවන තත්වයක් ව්‍යුහයක් කියලා භාරගන්න පුළුවන්. අනික ව්‍යුහය එහෙමම තිබෙද්දී, ව්‍යුහය වෙනස්කලා කියලා බාර ගන්න පුලුවන්. මේක නිර්ණය කරන්න වුවමනා නම් "භාවිත ආකෘති" වශයෙන් තමයි බලන්න වෙන්නේ. නිදසුනකට ශරීරයට දුෂ්කර භාවිතයන් බොහෝ වෙලාවට භෞතික සිතුවිලි නිකුත් කරනවා. මේවා කොහොම වුනත්, ලෝකය පුරා අළුත්ම විලාසිතාව වෙලා තියෙන්නේ හැම දෙයක්ම භෞතිකයි කියන එකයි. මේක ලෙහෙසියි, ආසයි. ඒ වුනත් භෞතික කියන ස්ථාවරයට මේ තරම් නිරපේක්ෂ ආදරය මොකටද කියලා කව්රුවත් කියන්නේ නැහැ.

පාරභෞතික නිමේශයට පණ ලැබෙන්නේ සිතුවිලි අතර සම්බන්ධතා ක්ෂේත්‍රයේදී. භෞතික සිතුවිල්ලක් විඥාන සිතුවිල්ලක් එක්ක සම්බන්ධ වෙන්න පුළුවන්. විඥාන සිතුවිල්ලක්, භෞතික සිතුවිල්ලක් එක්ක සම්බන්ධ වෙන්න පුළුවන්. අපි සුවිශේෂ සංයුක්තයක් අරගමු. විඥාන සිතුවිල්ලක් විඥාන සිතුවිල්ලක් එක්ක සම්බන්ධ වුනාම හැදෙන නිමේෂය විඥාන නිමේෂයක්. ඒ වුනත් මිනිස් විශ්වයේ ඒ ක්‍රියාකාරීත්වය භෞතිකයි. මේ උභතෝකෝටිකය කුරුසේ ගහලා නිරීක්ෂණය කරන්න බැරි නිසාම පාරභෞතිකවාදයේ ඉඩ ප්‍රමාණය 19 වැනි ශත වර්ෂයේ මුල ඉඳන් විශාල ලෙස වැඩි වෙන්න ගත්තා. 20 වැනි ශත වර්ෂය වෙන කොට පාරභෞතිකවාදයේ අණසක මොන තරම්ද කියන්නේ අනාගතය ගැන හිතන, කියන, කරන හැම දෙයක්ම පාරභෞතිකයි කියලා හිතන්න තරම් මිනිස්සු නිර්මාණය වුණා. ඉතිං, හැම න්‍යායක්ම පාරභෞතිකයි. මොකද න්‍යායන් අනාගතවාදී නිසා. අනාගතයේ හදන ගෙයකට සැලසුම් ඇඳලා ඒ මත අනාගතයේ දී ගෙයක් හදන ගමන්, පාරභෞතිකය ගැන ජප කරන එක අපේ ලාංකික වටපිටාවේ අතිශය සුලබ දර්ශනයක්.



විඥාන සිතුවිල්ලක් භෞතික සිතුවිල්ලක් එක්ක කෙසේ වෙතත් විඥාන සිතුවිල්ලක් භෞතික භාවිතයක් නිසා හටගන්නා සිතුවිල්ලක් එක්ක සම්බන්ධ වෙන හැම නිමේශයකම මිනිස් විශ්වයේ පීඩනයක්, ගැටුමක්, අසහනයක් අනිවාර්යයි. අනෙක් අතට මේ පීඩනය, ගැටුම, අසහනය පවා භාවිතයක් නිසා ඒකෙනුත් සිතුවිලි උපදිනවා. නැවත ඒ සිතුවිලි භෞතිකද විඥානද කියලා හඳුනගන්න වෙන්නේ ඒ පීඩනය, ගැටුම, අසහනය ජනිත වුණු තැන ව්‍යුහයක් වෙනස් වුණාද කියන එක මතයි. ඉතිං, මිනිස් ජීවිතයකට මහා පරිමාණයෙන් ගහේ යන්න පුළුවන් වීම අහම්බයක් නෙවෙයි. හරි දෙයක් කරන්න හිතාගෙන, හරි දෙයක් කරනවා කියල හිතාගෙන වැරදි දෙයක් කරන්නත් පුළුවන්: ඊටත් වඩා එයා කරන්නේ වැරැද්දක් බව කවදවත් වටහා ගන්නෙත් නැතිව. දැන් අපට තේරෙනවා මිනිස් ජීවිතයේදී භාවිතයකට පස්සේ එයට අදාලව හිතෙනවා කියන එක මිනිස් ස්වභාවය, ලෙහෙසිය, ආශාව; හිතලා භාවිතයේ යෙදෙන එක අස්වාභාවිකත්වය, අමාරුව, අකමැත්ත. පරපීඩා ලිංගික තෘප්තිය පුහුණුවන අය ලිංගිකත්වයේ මහා නිර්මාණාත්මක අය වෙන්නේ මේ මිනිස් ස්වභාවය නිසයි. ග්‍රාම්‍ය විධියකට කියනවා නම් පරපීඩා ලිංගික තෘප්තිය හැම දෙයකටම සාපේක්ෂව නරකක් වුණාට මිනිස් මනසේ ක්‍රියාකාරීත්වයට සාපේක්ෂව හොඳක්; මොකද මොකක් හෝ එයාගෙ ලිංගික" භාවික ආකෘතිය" ඇතුලේ එයා භෞතිකව පවතිනවා කියන එකයි; කිසිදු ගහේ යාමක්, මතවාදයක් නැතුව එයාගේ ලිංගික තෘප්තිය ගැන එයා "දැනුවත්" කියන එකයි. මේ "දැනුවත්කම" එයාගෙ ශරීරයට, අනුන්ට දක්වන සහෘදභාවය වෙනම කාරණයක්. (සාද් කියන එක්කෙනා "ලිංගික මනෝ විද්‍යාවේ" ආරම්භකයා වශයෙන් ලියාපදිංචි වුනේ අහම්බයකින් නෙවෙයි.) ජීව විද්‍යානුකූල ශරීරයේ ලිංගික තෘප්තිය වෙනුවෙන් භෞතික ව්‍යාපාරයක් පහසු වුණාට, සමාජ භෞතික ව්‍යාපාරයක් මොනතරම් අපහසුතාවයක්ද කියලා හැමෝම දන්නවා. ඒ වනාහි තමන්ගේ භෞතික සිතුවිල්ලට, අනෙකාගේ විඥාන සිතුවිල්ලක ප්‍රතිචාරය ගැන කථාවක්. ඒ වනාහි අනෙකාගේ විඥාන සිතුවිල්ලට තමන්ගේ භෞතික සිතුවිල්ලක පරිත්‍යාගය ගැන කථාවක්. රාජ්නීෂ් කියන එක්කෙනා මේකට යෝජනා කළේ, හැමෝටම, හැම නිමේශයකම, ඒ නිමේෂය ගැන දැනුවත්ව, හිතමින් වැඩ කරන්න කියලා. නිදසුනකට මිනිස්සු පාරේ නිදගෙන ඇවිදිනවා, අවදියෙන් ඇවිදින්න කියලා. රාජ්නීෂ් මේ තත්වය දේශනාවක් නොකර යම් යම් "පුහුණුවීම්" වශයෙන් ගොනු කළා. ඉතිං, එතැන සමාජයීය භෞතික ව්‍යාපාරයක අවකාශය දළ දැම්මා. රාජ්නීෂ් ජීවත් වුණේ, රාජ්නීෂ්පුරම් කියන "පවුල" ඇතුලේ.

"පවුල" වනාහි, බහුතරයක් භෞතික ව්‍යාපාර කියන එක අළුත් ඇත්තක් නෙමෙයි. අනික පුද්ගලයෙක් ප්‍රාග්ධනය රැස් කරනවා කියන්නෙත් භෞතික ව්‍යාපාරයකට. මෙතන ගැටළුව තමයි මේ ව්‍යාපාර දෙක විකාශනය කරන්න බැරි පරිධියක් පැවතීම. ඒ පරිධිය නැතිනම් ඒ ව්‍යාපාරත් නැහැ; මේ ව්‍යාපාර ඇතුලේ අනෙකාට, සමාජයට ඉඩක් නැහැ. ප්‍රාග්ධනයයි, පවුලයි පෞද්ගලික ජීව විද්‍යානුකූල ශරීරයක් කේන්ද්‍ර කරගෙන, ඒ වෙනුවෙන් ක්‍රියාකාරීවන ව්‍යාපාරයන්. මේ නිසා පවුලටයි, ප්‍රාග්ධනයටයි මානුෂික වෙන්න පුළුවන් වුණාට සමාජයීය වෙන්න බැහැ. හරියටම පවතින සමාජයේ ගැහැණු ශරීරයක් වගේ. ගැහැණු ශරීරයකට මානුෂික වෙන්න පුළුවන්, සමාජයීය වෙන්න බැහැ. පවුල් සීමාව ඇතුලේ ගැහැණු ශරීරයකට

මානුෂික වෙන්න පුළුවන්. ඒ ශරීරයම සමාජයීය වෙන්න ගියොත්-මානුෂික ප්‍රවේශයෙන්-සමාජය නිර්මාණය කරන්නේ වේසියෙක්ව; "සමාජයීය මානුෂික ගැහැණියක්" ව නෙවෙයි. කොටින්ම එහෙම සංකල්පයක්වත් නැහැ. රාජනීශ්ගේම නිදසුනින් කියනවා නම් 1. රොනල්ඩ් රේගන්, රාජනීශ්ව ඇදලා රාජනීශ්පුරම් වලින් දොට්ට දානකොට හොඳට අහුරිලා හිටපු රාජනීශ්ට අත් අඩංගුවට පත් වෙනවා හැරෙන්න කරන්න දෙයක් තිබුණේ නැහැ. 2. අනෙක් අයව රාජනීශ් ඇහැරවන්න ගිහිං එයා වඩ වඩා ඇහැරුණු එකයි, ඒ නිසාම අනික් අයට සාපේක්ෂව "ඇහැරෙන්න අවකාශය" එයාට වැඩියෙන් ලැබුණු එකයි සත්‍යයක්. ඔන්න පවුල ඇතුලේ භෞතික ව්‍යාපාරයක සීමාව; එක්කෝ පවුල ඇතුලේ මනුස්සකම- එහෙම නැතිනම් පවුලෙන් පිට වේසකම !

ඉතිං, පාරභෞතික නොවී පවතින්න මිනිසුන්ටට බැරි වීම පසෙක තිබ්යදී පුරුෂ ශරීරවලට සාපේක්ෂව ගැහැණු ශරීරයකට වේසියෙක් නොවෙන්න නම්, දර්ශනික වෙන්න උත්සාහ ගන්න නම්, පවුලෙන් පිට නොයන්න නම් පාරභෞතික වීම අනිවාර්යයක්.

## ගැහැණු ශරීරය - පුරුෂ භාවිතය

ගැහැණු ශරීරවලින් නික්මෙන්නේ ස්ත්‍රී සිතුවිලි නම්, සමාජය සහ ජීවිතය පුරුෂ නම්, "ගැහැණු ශරීරයක් ජීවත්වීම" කියන්නේ අපි දැනටම "දන්න" දෙයක් වෙන්න බැහැ. ඒ කියන්නෙ ගැහැණු ශරීරයක ජීවිතය "සමාජ විද්‍යාවට" ග්‍රහණය වෙන්නේ නැහැ කියන එකයි. "සිතුවිලි ස්ත්‍රියි, භාවිතය පුරුෂයි", මේක පවතින්න පුළුවන් (ඇත්තක් ගැන) වාක්‍යයක් ද. නිදසුනකට ස්ත්‍රී සිතුවිලි සහිත ශරීරයකට පවතින්න නං වඩ වඩා දර්ශනික වෙන්න ඕන කියන උභතෝකෝටිකය සමාජ විද්‍යාවට විසඳන්න බැහැ. අපි ඒ ගැන බලමු.

ගැහැණු ශරීරය වර්තමානයේ ජීවත්වන සන්දර්භය විස්තර කරන්න එංගල්ස් කියන එක්කෙනා ඉතිහාස කථාවක් ගෙතුවා. ඒ කථාව මෙහෙමයි. දේපොළ පුද්ගලික වෙන්න ගත්ත දවසේ ඉඳන් (දේපොළ ප්‍රාර්ථනය වෙන්න ගත්ත දවසේ ඉඳන්) පුරුෂයාට ඕන කළා තමන්ගේ දේපොළ තමන්ගේම අයිතියේ තියන්න. මෙතැනදී, තමන්ගේ දරුවා තමන්ගේම කියලා සහතික කරන්න නම් ඒ දරුවා ලැබෙන ගැහැණු ශරීරයේ ලිංග ඉන්ද්‍රිය තමන්ගේ දේපොළක් බවට පරිවර්තනය කළ යුතුයි. එතකොට තමන්ට ඕන තරම් පවුලෙන් පිට ගැහැණු ශරීර සමග ආශ්‍රය කරන්න පුළුවන්. නමුත් තමන්ගේ ගැහැණු ශරීරය එහෙම කිරීම තහනම්. මොකද පවුල වෙනුවෙන් එයාගෙ ලිංගේන්ද්‍රිය එක පුරුෂ ලිංගේන්ද්‍රියකට ඉඩ දෙන්න ඕන නිසා. සමාජයේ ආර්ථික ඒකකය විදියට පවුලට තියෙන ස්ථානය විස්තර කරන්න මේ කතාන්දරය වටිනවා වුණාට.....

නිකමට අපි හිතමු, පවුල ආරම්භ වුණේ ගැහැණු ශරීරයකට පුද්ගලික දේපොළ තමන්ගේ බාරයේ තියාගන්න කියලා. එතකොට පෞද්ගලිකකරණය වෙන්න ඕන පුරුෂ ලිංගේන්ද්‍රිය. මේ අදහස ඛණ්ඩනය කරන්න පුළුවන් සංකල්ප සෙල්ලමකින් විතරයි. එකක් ටිකක් ප්‍රබලයි. අනික දුර්වලයි. ප්‍රබල එක තමයි, පවුලෙන් පිටත ලිංගික සම්බන්ධයක දී ගැහැණියට ලැබෙන දරුවාට සංකල්පයක් තිබුණට (අවජාතකයා-



කොහේ හෝ ජාතක ලිංගේන්ද්‍රියක් තිබීම නොසැලකීම) පවුලෙන් පිටත පුරුෂයාට ලැබෙන දරුවාට සංකල්පයක් නැතිවීම. (පර පුරුෂයාගේ ලිංගික සම්බන්ධයෙන් ලැබුණු දරුවත් ඒ පෞද්ගලික ස්ත්‍රියගේ පවුලේම සාමාජිකයෙක් වීම). දුර්වල එක තමයි කන්‍යාභාවයට තියෙන මිල (ඒ සමගම පන්තියෙන් ඉහල පෞද්ගලික ස්ත්‍රී ලිංගේන්ද්‍රයට තියෙන මිල) පුරුෂ කන්‍යාභාවයට නැතිවීම. මෙතන තර්කය තමයි, (ආදරයේ යථාර්ථය 1 කෘතියෙන් මමත් මෙහෙම තර්ක කළා) පවුලේ ආර්ථික නිශ්චය නිසා පෞද්ගලික ගැහැණු ලිංගේන්ද්‍රිය වෙළෙඳ වටිනාකමකට යටත් වෙනවා කියන එක. එහෙත් මේ වෙළඳ වටිනාකම එන්නේ, පුරුෂ ශරීරවල ලිංගික අවශ්‍යතාවයේ ආකෘතිය නිසා කියලා අපි හිතුවොත්, කොටින්ම දර්ශනික ලිංගේන්ද්‍රියකට දර්ශනික නොවන ලිංගේන්ද්‍රියක අවශ්‍යතාවයෙන් කියලා හිතුවොත්. මෙතැනත් ෂෙන්තිප්පෙගේ ඩෙරීඩාගේ සෙල්ලම වගේ පිළිතුරු නැති ගැටළු ඉතුරු වෙනවා. එංගල්ස් ගැන කියන කොට එයාගේ කතාන්දරය පවුලට සාපේක්ෂ කරලා බැලුවම ප්‍රබල මදි. නිදසුනකට පවුලෙන් පිට ලිංගික නිදහස භුක්ති විඳින එක පුරුෂ ශරීර විකරක් නෙවෙයි ගැහැණු ශරීරත් කරන දෙයක්. එකම කාරණය එතැනත් වේසි කියලා ප්‍රබල සංකල්පයක් තියෙනවා. ඒ වුනත් ඒවා අයිති ලිංගික ගැටළු තීරයටද කව්ද දන්නේ. (ගැහැණු ශරීර ලිංගික තෘප්තිය රහිත සේ වටහා ගැනීම-මේකත් හරවලා පුරුෂ ශරීරවල භීතියක්-මතිභ්‍රමයක් විතරයි.) එහෙමත් නැතිනම් මේක ගැහැණු ශරීරය පෞද්ගලික වෙන ගමන් (වේසියක් නොවෙන ගමන්) දර්ශනික කිරීමේ එංගල්ස්ගේ පුරුෂ උවමනාවක් ද කව්ද දන්නේ. අපි හොඳට දන්නවා මේ කතාන්දරයෙන් වල්මත් වුණු ශ්‍රේෂ්ඨ විප්ලවවාදී ලෙනින් එයාට ඕන කරන ගැහැණු ශරීර (දර්ශනික) ලැබීම ගැන "වතුර බොන තරම්" අනාගත ලිංගික තෘප්තිය සරල කරලා, එයාට ඕන නැති ගැහැණු ශරීර (වේසියෝ) වෙන් කරන්න "කුණු කාණුවෙන් කව්රුවත් වතුර බොන්නේ නැහැ" දක්වා පහත් සදාචාරයක් දේශනා කළා. අර කතාන්දරයේ එක්කරා භෞතික පැවැත්මක් ලෙනින්ගේ සදාචාරයෙන් එළිවෙනවා. ඊටත්-වඩා කොමියුනිස්ට්වාදී යෝනි මාර්ග සඳහාම පිස්සු බල්ලන් වගේ ස්ත්‍රීවාදය හදරන පුරුෂ ශරීරවල ගාමක බල වේගය පවා අර එංගල්ස්ගේ කතාන්දරයමයි.

නිරපේක්ෂව ස්ත්‍රී සිතුවිලි නරකයි කියලා කවුරුවත් කියන්නේ නැහැ. ගෙදර තියෙන කල් ස්ත්‍රී සිතුවිලි සිරිකතක් වගේ යහපතක්. ස්ත්‍රී සිතුවිලි පාරට බැස්සමයි නරක. විශ්ව විද්‍යාල දේශනාගාරයට ගියාමයි නරක. මේක වැදගත් කාරණයක්. ගෙදර මල් වවලා, රෙදි හෝදලා, රසට කෑම උයලා, සංකීර්ණ නිර්මාණාත්මකතාවයන් සහිත ගැහැණු ශරීරය පාරෙදි නිර්මාණාත්මක නැති මලම්නියක් වගේ බීම බලාගෙන ඇවිදිනවා නං එතන ස්ත්‍රී සිතුවිලි ගැන දර්ශනවාදයට ගැටළුවක් නැහැ. දර්ශනවාදය ඒ වගේ තත්වයන් හඳුන්වන්නේ චිත්ත ඒකාග්‍රතාවය, විනීතකම වගේ සංකල්ප වලින්. ඇත්ත තත්වයේදී අර වගේ බිම බලාගෙන පාරේ යන ගැහැණු ශරීරයක සිතුවිලිවලට මොන කෙහෙම්මලක් වෙනවද කියලා කව්රුවත් දන්නේ නැහැ. ගැහැණු ශරීර දන්නේත් නැහැ. ඒක නිකම්ම දර්ශනවාදයේ තහනම් නියෝග පිළිපැදීමක් විතරයි. අපි හිතන විදියට හිතන්නේ නැති නිසා පිස්සකුට කරන්ට් ඇල්ලීමක් විතරයි. අහඹුවකින් හරි ගැහැණු ශරීර රංචුවක් මේ තහනම් නියෝගය කඩලා පාරේ හැසුරුණොත් පුරුෂ ශරීරවල දර්ශනික ඇස් ලොකු වෙනවා. ඒ අහිංසකයින්ට (පුරුෂ ශරීරවලට) නිමේෂයකට දේවල් වැටහෙන්නේ නැතුව යනවා.

ලෝකයේ කවුරුත් දන්නේ නැති ගැහැණු ශරීරයක මේ පැවැත්ම, ජීවිතය ගැන අපි හොයන්න දහලලා බලමු. විඥාණ සිතුවිල්ලක් භෞතික සිතුවිල්ලක් එක්ක ගැටෙන හැම තැනකම පීඩනයක්, ගැටුමක්, අසහනයක් මතුවීම අනිවාර්යයි. ඉතිං, නිර්මාණාත්මකව ඉපිලෙන ගැහැණු ශරීරයක් බිම බලාගෙන ඇවිදින කොට සිතුවිලි පීඩාකාරියි, ගැටුම්කාරියි, අසහනකාරියි.

* හොඳට කථා කර කර ඉන්න පෙම්වතා අවස්ථාවක් ලැබුණු වහාම මල්ලව පොර ගැටයකින් තද කරලා ඉඹින එක
* යම්තම් ඉහළට ඉස්සුවත් ජංඝිය පෙනෙන, යම්තම් පහළට ඇද්දත් ජංඝිය පෙනෙන සායකින් යෝනි මාර්ගයක් නැති එක්කෙනෙක් විධියට හැසිරෙන එක
* ඕනෑම පුරුෂ මිතුරෙක් කමන් කරා එන්නේ යෝනි මාර්ගය භුක්ති විඳින්නද යන උභතෝකෝටිකය තුළින් සමණක් බලන්න වෙන එක
* එහා මෙහා වුණාම තනේ ආරම්භය පෙනෙන සාරිපොට, තන පෙනෙන නොපෙනෙන විධියට තියාගන්න එකක්, විනාඩියෙන් විනාඩියට තට්ටම ඉලිප්පෙන සාරිය තට්ටම පෙනෙන නොපෙනෙන විධියට තියාගන්න එක
* උණුසුමට ඇතිල්ලි ඇතිල්ලි ඉඳල අවස්ථාව ලැබුණු වහාම තමන්ව යට කරගෙන යන්ත්‍රයක් වගේ සංසර්ගයේ යෙදෙන එක
* අහි බැම් පිරීම, නලල පාට කිරීමේ ඉඳන් කකුලේ ඇහිලි දිස්නය කිරීම දක්වා දවස ගානේ වේෂ නිරූපණය කරලා තමන්ගේ යෝනි මාර්ගය අයිති පුරුෂයා හැරෙන්න අනිත් අයගේ ප්‍රතිචාරය නොදකින විධියට අහක බලන එක
* හැම දෙයක්ම දැන ගැනීමට ආශාව තිබුනත් ගෙදරින් පිට ලෙඩෙක් වගේ හැසිරිලා- නිරීක්ෂණය නොකරන්නෙක්-ගෙදරදී විතරක් අධ්‍යාපනයේ යෙදෙන එක
* තමන්ගේ යෝනි මාර්ගය අයිති පුරුෂයාට උපරිමයෙන් ලිංගිකව සහයෝගය දෙන ගමන් ලිංගික ආශාවන් නැති ශරීරයක් වශයෙන් පෙනී හිටින එක
* තමන්ගේ යෝනි මාර්ගය අයිති පුරුෂයාගේ මිතුරන් ඉස්සරහ උපරිම සමාජයීය වෙන ගමන් පුරුෂයා නැති තැන සමාජයේ ලෙඩෙක් වගේ හැසිරෙන එක
* කොටින්ම වේසියක් නොවී දර්ශනවාදියෙක් වෙන එක

පීඩාකාරියි, ගැටුම්කාරියි, අසහනකාරියි.



ගැහැණු ශරීරවල කඳුළුවල තියෙන විප්ලවීය ශක්‍යතාවය මේකයි. කඳුළුවල විප්ලවීය අවකාශයත් මේකයි. ගැහැණු ශරීර තමන්ගේ සිතුවිලියි, ජීවිතයයි අතර ගැටුම විසඳගන්නේ එක්තරා අසමබර පැවැත්මකින්. මේ අසමබරතාවය දර්ශනිකව හඳුන්වන්නේ හිස්ටීරියාව (මායා රෝගය) කියලා. අපි "බෙහෙත් තුණ්ඩු" කියන කාන්තා පත්තර ඔක්කොමවල තියෙන්නේ මේ අසමබරතාවයේ සෝ සුසුම්. හිස්ටීරියාවේ මතවාද තමයි ඒ පත්තරවල විෂය ක්ෂේත්‍රය. ඉතිං, ගැහැණු ශරීර තමන් ගැන දැනගන්න ඒ පත්තර කියවනවා. පිරිමි ශරීර ගැහැණු ගැන දැනගන්න ඒ පත්තර කියවනවා. ගැහැණු ශරීරවල උවමනාව දර්ශනික එකක්. පුරුෂ ශරීරවල උවමනාව ලිංගික එකක්. කොහොම හරි උවමනාවන් දෙකම පුරුෂවාදීයි. බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා කියලා ලියාපදිංචි කෙනා වන හිපොක්‍රටීස් කීවේ හිස්ටීරියාව නැති කරන්න නම් ගැහැණු ශරීරයට සංසර්ග "කරන්න" ඕනැයි කියලා. එහෙම නැත්නම් බඩ කරවන්න ඕන කියලා. ඔන්න ගැහැණු ශරීරවල ප්‍රධාන අසනීපයයි, ඒ අසනීපයේ වෛද්‍ය ප්‍රතිකාරයේ ස්වභාවයයි. අදත් අර කාන්තා පත්තර කියවන පුරුෂ ශරීරවල අවශ්‍යතාවය හිපොක්‍රටීස්ගේ ප්‍රතිකාරයම ද කව්ද දන්නේ.

දර්ශනවාදය පවතින්න නම් පවුල අනිවාර්යයක් වගේම, දර්ශනවාදය පවතින්න හිස්ටීරියාව අනිවාර්යයක්. සොක්‍රටීස් දර්ශනිකයෙක් වෙන්න ෂෙන්තිප්පේ "එයාගෙ" දරුවා වඩාගෙන ඉන්න ඕන. සොක්‍රටීස්ගේ දර්ශනවාදයට ජීවය ලැබෙන්නට ෂෙන්තිප්පේ ලතෝනි දි දී අඩන්න ඕනේ. සමාජ අර්බුදයක් නිසා හටගන්න හිස්ටීරියාව "ලිංගික රෝගයක්" ලෙස දකින එක, සමාජ විද්‍යාව "ලිංගික විද්‍යාවක්" බවට පරිවර්තනය වීමක්. වෙනත් විධියකට මේ ගැටළුව ස්ථානගත කරන්න පුළුවන්, දර්ශනවාදය වනාහි පුරුෂ ශරීරවල ලිංගික උවමනාවක් ද කියලා ඇසීමෙන්. කොහොම හරි ගැහැණු ශරීරවල භාවිතය ඇගැයීමේ දී සමාජ විද්‍යාව, ලිංගික විද්‍යාවක් බවට පරිවර්තනය වීම අපි පරීක්ෂා කරමු.

## සමාජ විද්‍යාව ගැහැණු ශරීර ඇගැයීමේ දී සංසර්ග කේන්ද්‍ර වීම

විශාල පරීක්ෂණයකින් උතුරලා යන ක්ෂේත්‍රයක් මේක. අන්ධයෝ එකතුවෙලා ඉතිරිම හොයපුවාවේ. පුංචි ඉවකට අපි සීමා වෙමු.

නිදසුනකට මේ ප්‍රවාදයේ කලින් කොටසක (ප්‍රවාද කලාප අංක 8-පිටුව 99) ෂෙන්තිප්පේ හා ඩෙරීඩා අතර සම්බන්ධය මතු කරන කොට පහසුම ප්‍රවේශය තමයි සංසර්ග කේන්ද්‍රීය වීම. එතකොට ස්ත්‍රී ශරීරය විශාල සන්දර්භයක අගැයීම අහිමි වෙනවා. සංසර්ගය විශාල සන්දර්භයක ඇගැයීම අහිමි වෙනවා. ඉස්සරහට යන්න කලින් මේ සරල ක්‍රියාවලිය (.....ගේ....ණු.... න ...ට සීමාවන ලෝකය) මතු කරගෙන යමු. සමාජය වැඩ කරන්නේ වස්තු අනුව නෙවෙයි, සංකේත අනුව. මේ අප්‍රභංශය, ඒ කියන්නේ සමාජය වැඩ කරන්නේ වස්තු අනුව නෙවෙයි සංකේත අනුව කියන එක තේරුම් ගන්න පහසුම මාතෘකාවත් සංසර්ගයමයි. ගැහැණු ශරීරය කියපු ගමන් සංකේත වැඩ කරන්නේ මෙහෙමයි. ගැහැණු ශරීරය = යෝනි මාර්ගය = හිස් ඉඩස = පිරවීම = පුරුෂ ලිඟුව ඇතුල් කිරීම = ශුක්‍රාණු පහවීම. ඉතිං, ගැහැණු ශරීරය කීවාම ඒක වියුක්තව දකින්න කාටවත් ඇස්වත් මනසක්වත් නැහැ. ගැහැණු ශරීරය නිමිත්තක් වුණ ගමන් එතන යෝනිය, හිස්කම, පුරුෂ ලිඟුව, ශුක්‍රාණු මේ ඔක්කොම ගැවසෙනවා. පුරුෂ ශරීරය කියාපු ගමන් සංකේත වැඩ කරන්නේ මෙහෙමයි. පුරුෂ

ශරීරය = ලිංගේන්ද්‍රිය = ශුක්‍රාණු = පහකිරීමට ස්ථානයක්. කොහොමද, මොන තරම් අපූරු විධියට ලෝකය හැම තත්පරයකම ගැහැණු ශරීරය දූෂණය කරනවාද. පුරුෂ ශරීර, දූෂකයෝ කරනවාද. හරියට සංසර්ගයට වඩා දෙයක් ලෝකයේ නැතුව වගේ. නමුත් අපි ජීවත්වන ලෝකයේ සංසර්ගය මේ තරම් සීඝ්‍රගාමී නැහැ කියලා අපි දන්නවා. අනික් අතට සංකේත ලෝකයේ සංසර්ගය බොරුවකුත් නෙවෙයි. මේ ආතතිය විඳවන්න වෙන්නේ මිනිසුන්ට, සංකේතවලට නෙමෙයි. අර කලින් සඳහන් කල සරල ක්‍රියාවලියේ වරහන් ඇතුලේ තියෙන්නේ; පුරුෂයින්ගේ ශුක්‍රාණු පහවෙන එකට සීමාවන ලෝකය.

(1) ලිඛිත අකුරු සම්ප්‍රදයෙන් පටන් ගනිමු. බයිබලයේ පැරණි ගිවිසුම අනුව ගැහැණු ගැන දැනගන්නවා කියන්නේ පුරුෂ ලිඟුවක් ඇතුල් කිරීමට. එතැන මෙහෙම කියැවෙනවා. පුරුෂයා තමන්ගේ භාර්යාව හැරෙන්න වෙනත් ගැහැණියක් දැනගැනීම පාපයක්. මෙවැනි දැනගැනීමකට පොළඹවන ප්‍රධාන බලවේගය සාතන්ය. ගැහැණු ශරීරයක් ගැන "දැනගන්න" පුරුෂ ලිඟුවක් ඇතුල් කිරීම මාධ්‍ය නම්, එවැනි දැනගැනීමක තියෙන්න පුළුවන් දේවල් අපට වැටහෙනවා. ගැහැණු ශරීරය වටහා ගන්නා පරමෝත්කර්ෂය තමයි ශුක්‍රාණු පහවීම. ඉතිං බලන්න, ගැහැණු ගැන දැනගන්නවා කියන්නේ සංසර්ගයට.

(2) ජ්‍යොතිෂයේ, කාම සූත්‍රයේ, ස්ත්‍රී චිකිත්සාවලියේ ගැහැණු ශරීර වර්ගීකරණය වෙනවා. හොඳම හරිය තමයි මේ සම්ප්‍රදයන් තුනේම නිශ්චිත කාණ්ඩවල ගැහැණු ශරීරවල ගතිගුණ සමාන වීම. යටින් තියෙන පදනම තමයි යෝනි මාර්ගය. කාම සූත්‍රය අනුව පුරුෂයාගේ ලිංගේන්ද්‍රියේ ප්‍රමාණය. ගැහැණුන්ගේ යෝනියේ ප්‍රමාණය ගැඹුර. ස්ත්‍රී චිකිත්සාවලිය අනුව යෝනි මාර්ගය පිහිටි ස්ථානය.

(3) හර්මොප්‍රොඩිටිස්ම් = ඉයොනිසම්, හෝමොසෙක්ස් = ග්‍රීක් ලව්, ලෙස්බියන් ලව් = ෆොනොෂියන් ලව් = සැපිස්ම්, ඉන්සෙස්ට්, බෙස්ටියල් = සූපිලියා = සූළුරෙස්ටියා = සූලෙශ්නියා = සූමෙනියා, පෙඩොරොසිස් = පෙඩොපිලියා ඉරොටිකා = ෂුනොම්ටිස්ම්, ක්ලෙප්ටොමේනියා = ක්ලෙප්ටොපේනියා = ඔනියෝමේනියා, පිරෝමේනියා, නිම්පෝමේනියා, නාසිස්ම්, එක්සිබිෂනිස්ම්, සොඩොමි, පෙඩරස්ටි, මැසොචිස්ම්, සේඩිස්ම්, නෙක්රොෆීලියා, කොප්රොපිහේමියා = කොප්රොලේලියා, පිග්මැලියනිස්ම්, ස්කැටෝලොජි, ස්කොපොෆීලියා, යූරෝලෙග්නියා, ෆ්‍රොරොටේරස්, බුකාල් කොයිටස් ....,..... ඉහත සඳහන් වෙන්නේ ලිංගික තෘප්ති ආකෘති 25 ක නම්. ඒවායේ අන්වර්ත නාම එක්ක බැලුවම ලිංගික තෘප්ති ආකෘති 37ක්. මේ ලිංගික තෘප්තිය 25 ම (නැත්නම් 37 ම) ලෝකයේ එක වර්ගයක් වශයෙන් හැඳින්වෙනවා. ඒ තමයි "අස්වාභාවික ලිංගික තෘප්තිය"; ඒ කියන්නේ සංසර්ගය තමයි "ස්වාභාවික ලිංගික තෘප්තිය" ? ඉතිං, කොහේ හරි පුරුෂ ලිංගේන්ද්‍රියක්-ස්ත්‍රී ලිංගේන්ද්‍රියක් තියෙන තැනකට තෘප්තිය මැදිහත් වුණාම හැම දෙයක්ම (ඒ කියන්නේ ඉහත 25) "නරක" වෙලා පුරුෂ ලිඟුව ස්ත්‍රී ලිඟුවට ඇතුල් කරන එක "හොඳ" වෙනවා. මෙන්න මේ නිසා යෝනියක් තියෙන තැනක තෘප්තිය පිළිබඳ භාෂාවේදී "හොඳ" දේ තමයි සංසර්ගය. යෝනිය අයිති ශරීරය ගැන කිසිම තැකීමක් නැතිව"හොඳ" වෙනුවෙන් සංසර්ගය මැදිහත් වෙනවා.

(4) ලිංගිකත්වය කියන ප්‍රදේශය නැත්නම් සිග්මන්ඩ් ෆ්‍රොයිඩ් කියන එක්කෙනාට, භාෂාවකුත් නැහැ– ජනප්‍රියත්වයකුත් නැහැ. ඕනෑම අයෙකුගේ ගතිගුණ හැදෙන්නේ



පොඩි කාලේ අපේ ලිංගික ආවේග නිසා. මේ ළදරු ලිංගික ආවේගය මොකට සාපේක්ෂද. පොඩි දරුවට, තාත්තගෙන් වෙන් කරලා අම්මා එක්ක සංසර්ගය බැරි වීමට සාපේක්ෂයි. තාත්තගේ මේ "අම්මව ග්‍රහණය කිරීම" මොකට සාපේක්ෂද. ඒ තමයි අම්මාගේ තියෙන "පුරුෂ ලිඟුවේ සංකේතයට තියෙන ග්‍රහණය". ඉතිං, ෆ්‍රොයිඩ්ගේ මුළු කෙටි කථාවම "බැරිවීම","ග්‍රහණය" මත පදනම් වෙලා. "බැරි" යෝනි මාර්ගය "ග්‍රහණයක්" හොයනවා, "පුළුවන් වීම" තමයි පුරුෂ ලිංගේන්ද්‍රියක් ඇතුල් කිරීම. සමාජයේ තියෙන "ග්‍රහණ අසහනය" කුමක් සඳහාද? පුරුෂ ලිංගේන්ද්‍රියක් සඳහාමයි. ෆ්‍රොයිඩ් කෙටි කථාවේ තිබෙන විභවය තමයි ගැහැණු ශරීරයක් තියෙන තැනක සංසර්ගය අනිවාර්ය කිරීම. ෆ්‍රොයිඩ් පෞද්ගලිකවම මේ සංසර්ගයේ යෙදෙන එක සාධකයක් තමයි අම්මව ග්‍රහණය කිරීම තේරුම් කරන්න එයා "පුරුෂ" දරුවෙක්ව තෝරා ගැනීම. ගැහැණු ශරීරය ගැන කථා කරන්න සංසර්ගය කේන්ද්‍ර කරගත්තෙ නැත්නම් සමාජ විද්‍යාව වෙනුවෙන් ෆ්‍රොයිඩ්ට කියන්න දෙයක් ඇත්තෙම නැතිවෙන්නේ එහෙමයි.

(අවවාදයයි... අච්චු අකුරු සම්ප්‍රදයන් පහක් "විවේචනය" වෙනවා. මේ විවේචනය භාරගන්න වෙන්නේ විසංයෝජනය කරලා විතරයි. මේ සම්ප්‍රදයන් පහ "වටහාගන්න" නම් ඒ ගැන හොයන්න වෙනවා. මෙතන වෙලා තියෙන්නේ සංවාදය ගොඩනගන්න ඒ සම්ප්‍රදයන් කොල්ලකාලා නිමිති භාවිතා කරපු එක විතරයි. මේ කොල්ලකෑමේ ක්‍රියාකාරිත්වය වනාහි "හැදෑරීමයි" කියලා දැනෙනවා නම් ඒ මේ ප්‍රවාදයේ තියෙන "දූෂක" ලක්ෂණයක්).

(5) ගැහැණු ශරීරය ගැන හොයන්න ගියාම සමාජ විද්‍යාව, ලිංගික විද්‍යාවට පෙරලෙන නූතනම උදාහරණය තමයි මිෂෙල් ෆූකෝ කියන එක්කෙනා. වැදගත්ම කාරණය එයා "කියාපු" දේ නෙමෙයි එයාට "සිද්ධ වුණු" දේ. එයා ගෙදරින් පිට වුණේ "ලිංගිකත්වයේ ඉතිහාසය" ලියන්න හිතාගෙන, ව්‍යාපෘතිය අනුව ඒක කාණ්ඩ හයක පොතක්. 1976 දී පළමු කාණ්ඩය එයා ලියුවා. මේ පරිච්ඡේදයේ අංක 3 ට තිබුණු ලිංගික ආකෘති වෙන් කිරීමේ දී යම් පමණට දායක වුණු "ක්‍රාෆ්ට් එබිං" කියන පුද්ගලයා ලිංගික විද්‍යාව නිර්මාණය කරන්න දායක වෙන හැටි ෆූකෝ පෙන්නුවා. ෆ්‍රොයිඩ් ව බරපතල විධියට භාර අරගෙන අනාගන්නේ නැතුව ෆ්‍රොයිඩ්ගේ කෙටිකථාව එයා නිරුවත් කලා. ආශාව විශ්ලේෂණය කරන නූතන ක්‍රියාකාරිත්වයක් ඇතුලේ ලිංගික විද්‍යාවක් නිර්මාණය වෙන හැටි එයා කීවා. මේ තමයි ෆූකෝගේ චේතනාව. හැබැයි එයාට සිද්ධ වුණු දේ ඊට හාත්පසින්ම වෙනස්. එයා ලිංගිකත්වයේ ඉතිහාසය හොයන්න වෙහෙසුනේ "අපි කවුද" කියලා හොයාගන්න. ආශාව විශ්ලේෂණය කරන එක ගැන එයා විවේචනය කලේ, "තෘප්තිය ගොඩනැගීම කේන්ද්‍ර කරගත යුතුයි" කියාගෙන. මිනිස් ජීවිතයේ කේන්ද්‍රීය තත්වයක් (සත්‍යයක්) හැටියට ලිංගිකත්වය භාරගත්ත නිසයි ෆූකෝ අපි කවුද කියලා හොයන්න ලිංගිකත්වය විෂය කරගත්තේ. ආසියාවේ අවුරුදු දහස් ගණනක සම්ප්‍රදයක් තියෙනවා අපි කවිද කියලා හෙවීමේ, ඒ වුනත් එතැන ලිංගිකත්වය යතුරක් නෙවෙයි. ෆූකෝ එකම තැනෙක පිළිගත්තා එයාගේ ප්‍රවේශය බටහිරවාදීයි කියලා. අනික ජීවිතය ගැන කථා කරන්න තෘප්තිය භාවිතා කළ ගමන් ආයෙමත් එතැනත් යතුර ලිංගිකත්වයමයි. සංසර්ගයෙන් දේවල් හොයන බයිබල් සම්ප්‍රදය මතක් වෙනවා. මේක මොන තරම්ද කියන්නේ

"ලිංගික විද්‍යාව" කියන සංකල්පය නිර්මාණය කළේත් ෆූකෝමයි. ඉතිං, මිනිස් තෘප්තියයි, අපි කව්දැයි වටහාගන්න ලිංගිකත්වය කේන්ද්‍ර කරපු එක්කෙනෙකුට විය යුතු දේ ෆූකෝට ලස්සනට සිද්ධ වුණා. ලිංගිකත්ව ඉතිහාසයේ 2 වැනි කෘතිය ෆූකෝ ලියල ඉවර වුණාම එයාට දැනුනා මේක මගේ විෂයට අදල නැහැ මේක ලිංගිකත්වය ගැන කෘතියක් කියලා. ඉතිං, ඒක එයා අහකට දැම්මා. ඊළඟට තව එකක් ලියුවම ඒකෙ ලිංගිකත්වය නැහැ, ඉතිං ඒකත් අහකට දැම්මා. ඊළඟ එකේ අපි කවුදැයි, ලිංගිකත්වයයි සම්බර කළා. ඒක තමයි අද ලිංගිකත්ව ඉතිහාසයේ 2 වැනි කෘතිය වෙලා තියෙන්නේ. 3 වැනි කෘතිය ලියන්න ගිහිනුත් මේ වැඩේම වුණා. ඊට පස්සේ ලියාපු කෘතිය තමයි අද 3 වැනි කෘතිය වෙලා තියෙන්නේ. ඉතිං, ඇත්ත තත්වය වෙලා තියෙන්නේ මේකයි, කාණ්ඩ හයකින් ලිංගිකත්ව ඉතිහාසය පටන් ගත්ත ෆූකෝ 1976 දී ලිංගිකත්වය ගැන එක පොතකුත් වෙන මොනවද විෂයන් ගැන පොත් පහකුත් ලිව්වා. 1983 දී ආපු ස්ත්‍රීවාදී ලිපි එකතුවක් ආරම්භ වුණේ ෆූකෝව විවේචනය කරගෙන. ආවේශ වුණු පුරුෂ සංසර්ග භාෂාව ෆූකෝ පාවිච්චි කරනවලු, එහෙම වීම අනිවාර්යයක්ලු. 1984 දී ෆූකෝ ලිංගිකත්වයේ ඉතිහාසය 3 වැනි කෘතියේ තැන් දෙකක වරහන් පාවිච්චි කරලා අපට පෙන්වනවා ලිංගිකත්වය ගැහැණු ශරීරයට කේන්ද්‍ර වීම එයාට වැටහෙනවා කියලා. එහෙත් සදාතනික සත්‍යය තමයි එක්තරා සමාජ විද්‍යාවක ගුණ අගුණ මනින්න එයා සංසර්ගය දර්ශකයක් කරගත්ත එක.

අච්චු, අකුරුයි, පවතින සංකේතයි කරන ප්‍රධාන කාර්යය ගැහැණු ශරීර දූෂණය කරන එක නං එවැනි සමාජයක විද්‍යාව, ලිංගික විද්‍යාවකට වඩා දූෂණයේ විද්‍යාවක් වෙනවා. මේ වනාහි කතාන්දරයේ එක කොටසක් විතරයි. ස්ත්‍රී සිතුවිලි වලින් බැලුවම ඉතිරි විශාලත්වය හෙළි වෙනවා. සමාජය, පුරුෂ අර්ථ, සමාජ විද්‍යාව, "එකම" යථාර්ථයක් තහවුරු කළාට ස්ත්‍රී සිතුවිලි ඔය දේවල් වලදී "ඒකීයත්" නැහැ-"ලිඛිතත්" නැහැ. අපි ඒ ගැන බලමු.

ලිංගිකත්වය කියන්නේ ශුක්‍රාණු පිටවීම තරම් පටු ක්ෂේත්‍රයක් නම් ස්ත්‍රී සිතුවිලි අනුව "ලිංගිකත්වය" කියලා දෙයක් නැහැ. ඇයි ගැහැණු ශරීරවලින් ශුක්‍රාණු පිටවන්නේ නැහැනේ. මොනවා හරි විද්‍යාවක් කරපින්නා ගත් පුරුෂයෙක් මෙතැනදී කීවොත්, ඔය තියෙන්නේ ලිංගේන්ද්‍රියක්, ඉතිං එතන තමයි ලිංගිකත්වය තියෙන්නේ කියලා, ගැහැණු ශරීරය මෙහෙම උත්තර දේවි; ලිංගිකත්වයක් මම දන්නේ නැහැ, * මේ ඉන්ද්‍රිය නිසා මට කරදරයි. * එක එකා ඕන ඕන වෙලාවට මේකට උගේ ඇඟ හේත්තු කරනවා. * දරුවන් වදන්නේ මේකෙන් * මේ ඉන්ද්‍රිය නිසාම මාව මරන්න පුළුවන් නිසා මම පරෙස්සම් වෙනවා...... යනාදී වශයෙන්. විද්‍යාඥයා : ඇත්ත කියන්න ඔය ඉන්ද්‍රිය ආශ්‍රිතව තෘප්තියක් සතුටක් දැනෙන්නේ නැද්ද?. * මේ ඉන්ද්‍රියට විශේෂ සතුටක් නැහැ. * පුරුෂ ලිංගේද්‍රිය ඇතුලට ගන්න එක වැඩි වෙලාවක වේදනාවක්. විද්‍යාඥයා : ඇත්ත කියන්න සුරතන්තය කියලා හැඟීමක් දන්නේ නැද්ද? * වැඩිපුර ගැහැණු ශරීර එහෙම හැඟීමක් දන්නේ නැහැ. * මගේ ම අතකින්, ලිංගේන්ද්‍රියකින්, වලින් මේ හැඟීම ලැබිලා තියෙනවා. * සුරතන්තයයි, මගේ ලිංගේන්ද්‍රියයි අතර සම්බන්ධයක් නැහැ. මොකද කථා කර කර ඉන්න කොටත් මට මේ හැඟීම දැනිලා තියෙනවා. හීනෙනුත් දැනිලා තියෙනවා. විද්‍යාඥයා : බුදු අම්මෝ! ඇත්ත කියපං, සංසර්ගයෙන් සුරතන්තයට පත්වෙන්නේ නැද්ද?. * සංසර්ගයෙන් නම්



කවදාවත් සුරතන්තයට පත්වෙලා නැහැ. * (ආදරය නිසා නම් සුරතන්තයට පත්වෙලා තියෙනවා).

ඉතිං ජේනවද, ස්ත්‍රී අර්ථ අනුව විශාල ක්ෂේත්‍රයන් පුරුෂාර්ථ වෙනකොට තනි සංකල්ප වලට, පුංචි ක්‍රියාවල් වලට, තත්පර ගණනාවකට ගොනුවෙන එක-පරිවර්තනය වෙන එක. විශාල ජීවන භාවිතයන් සන්නිවේදනය වෙලා සම්ප්‍රදායන් වෙලා. ෆූකෝගේ අදහස් අනුව තෘප්තිය කියන්නේ ශුක්‍රාණු පහවෙන "එකයි". ෆ්‍රොයිඩ්ගේ අදහස් අනුව ලිංගිකත්වය කියන්නේ සුරතන්තයමයි. මේ තත්වයන් යටතේ සුරතන්තය විසංයෝජනය කළොත් ඩෙරිඩාගේ පුරුෂ ශරීරයට යන එන මං නැති වෙනවා. මේ නිසා ඩෙරිඩාගේ ව්‍යාපෘතිය ඇතුලේ "නිර්යෝනිමාර්ගීකරණය" වගේ ස්ත්‍රීවාදී සංකල්ප රිංගුවට "සංසර්ගීකරණය", "සුරතන්තකරණය" වගේ සංකල්ප රිංගන්න බැහැ.

## කාම සූත්‍රය සූත්තරයක් වෙන හැටි

කාම සූත්‍රය සූත්තරයක් වෙන එක බුදු හාමුදුරුවෝ, සූත්තර පුංචා වෙන තරමට විශාල අන්ත දෙකක්. හරියටම කියනවා නම් සූත්තර පුංචා බුදු වෙස් අරගෙන ඉන්නවා වගේ වැඩක්. කාම සූත්‍රය, "සූත්‍රයක්" වෙන එක ගැන බෞද්ධ මනසට කරදරයක් නැත්තේ ඒක මුළුමනින්ම පුද්ගලයාගේ සද්භාවයට උදව් කරන නිසයි. සුරතන්තය වරදින්නේ නැති පාඩම් (උපක්‍රම) කිහිපයක් ඒකේ තියෙනවා. හොඳම හරිය තමයි ස්ත්‍රී සිතුවිලිවලට මාට්ටු වෙන්නේ නැති වෙන්න මේ පාඩම් මාලාව ප්‍රවේශම් වුණු එක. ඒකයි ඒක උපක්‍රමයක් වෙන්නේ.

ගැහැණු ශරීරවලට පුරුෂ ලිංගේන්ද්‍රියෙන්, සංසර්ගයෙන් සුරතන්නයට පත් වෙන්න බැරි එක වාත්ස්‍යායන (කාම සූත්‍ර රචක) විතරක් නෙමෙයි සැම පුරුෂ ශරීරයක්ම දන්නවා. ඉතිං, මේකට සමාජයීය උත්තරයක් අවශ්‍යයි, මේ උත්තරය සැම පුරුෂ ශරීරයක්ම තවත් සැම පුරුෂ ශරීරයකටම උගන්වනවා. කාම සූත්‍රය කියන්නේ මේ අධ්‍යාපනයට. සංසර්ගයට කලින් ගැහැණු ශරීරයකට කළ යුතු "සාත්තු" සම්ප්‍රදායන් කිහිපයක් තියෙනවා. කාලය වශයෙන් මේකට පැයක් විතර ගත වෙනවා. ආරම්භයක් වශයෙන් මේ සාත්තුව නොවන්න යෝනිය තෙත් වෙන්නෙත් නැහැ. ගණිකා සංසර්ගයේ දී පුරුෂ ශරීරවලට තියෙන එක කොස්සක් තමයි ඒක. මේ "සාත්තුවට" සංස්කෘතීන් අනුව සංකල්ප ගණනාවක් තියෙන තරමට මේක "සවිඥානික", "තාර්කිකව", "දන්නා" ක්‍රියාවක් වුනත් පුරුෂ ශරීරයේ දක්ෂතාවය මනින්නේ මේ තත්වය (සාත්තු කිරීම) අවිඥානික, නොදන්න දෙයක් වශයෙන් කරන්න තියෙන පලපුරුද්ද මතයි. මේ සවිඥානය නැහැ කියලා පෙන්නන තරමට ගැහැණු ශරීර ඒක හඳුනගන්නේ (ගැහැණු මනසට, ශරීරයට දැනෙන්නේ) ආදරය කියලා. මේ ලිපියේ කලින් ජේදයක වරහන් ඇතුලේ තියෙන විධියට සංසර්ගයෙන් සුරතන්තය දැනෙන එකම ආකෘතිය (ආදරය නිසා නම් සුරතන්තයට පත්වෙලා තියෙනවා) ප්‍රයෝජනයට ගන්න පුරුෂ ශරීරය අර සාත්තුව කරන්න ඕනෙත් ඇහෙන්ම විධියටයි. ඉතිං, ගැහැණු ශරීරය රවට්ටන්න දන්නවා නම් ගැහැණු ශරීරය ඒක හඳුනගන්නේ ආදරය කියලයි. පුරුෂ ශරීරය දක්ෂනම් ගැහැණු ශරීරය සුරතන්තයට පත්කරන්න පුළුවන්. ගැහැණු ශරීරක් කාම සූත්‍රය කියෙව්වට ඒ අය හඳුනා ගන්නේ මේ ඔක්කොම

"රසවත්" වැඩ "ආදරයට පසු" නිමේෂයන් කියලා. පුරුෂ ශරීර දන්නවා රසවත් වැඩ තමයි ආදරය කියලා. පුරුෂාර්ථ අනුව "රසවත්" මේ උපායන් ටික ගැහැණු ශරීර අනුව "වංචාවේ කාලයේ රසයට" වඩා දෙයක් නෙමෙයි. ගැහැණු ශරීර ආදරය කියන නිමේෂය පුරුෂ ශරීර අනුව "ආශාව" වෙන එකත්, ආදරය කිරීම "සංසර්ගය" වෙන එකත් පුරුෂාර්ථ වල දී යට ගැහුවට ස්ත්‍රී සිතුවිලි හොඳට හඳුනනවා පුරුෂාර්ථ වල දී මේ දේවල් පටලවන සංවිධානාත්මක වැඩක් තියෙන බවට. පුරුෂ ශරීර වලට ආදරය ලාභ වෙන්නෙත්, ගැහැණු ශරීරවලට පස්මහ බැලුම් බලන ක්‍රියාවක් බවට පෙරලෙන්නෙත් කාම සූත්තර නිසයි. වැඩිය ඕන නැහැ, කාම සූත්තරය, "කාමසූත්‍රය" කියන විශ්ව විද්‍යාල නමින් ලියා පදිංචි වෙලා තියෙන්නෙත් ඒ නිසාමයි. ගැහැණු ශරීරවලට සුරතන්තය භාවනාවක් (ආදරය) වුණාට පුරුෂ ශරීරවලට කපටිකමක් (කාම සූත්තරය) විතරයි. ඉතිං, අපි දන්නවා පුරුෂ ශරීරයක සුරතන්තයක් විසංයෝජනය කරන්න පුළුවන් ඒක සනීභවනය තත්වයක් නිසා. එහෙත් ගැහැණු ශරීරයක සුරතන්තයක් විසංයෝජනය කරන්න බැහැ, ඒක සජීවී ක්‍රියාකාරීත්වයක් නිසා. ස්ත්‍රී සිතුවිලි අනුව කියනවා නම්, ශුක්‍රාණු පහ වුණාම පුරුෂ ශරීර සුරතන්තයට පත් වුණාට ගැහැණු ශරීරයක් ශුක්‍රාණු පහ කරන්නෙත් නැහැ– සුරතන්තයට පත්වෙන්නෙත් නැහැ; ගැහැණු ශරීරයක් පත්වෙන්නේ ආදර අන්තයකට. එකක් ප්‍රචණ්ඩයි, අනෙක මිහිරියි.

<u>පුරුෂාර්ථ අතර ජීවත්වන ගැහැණු ශරීරයක් ආදරය, ලිංගේන්ද්‍රිය, සුරතන්තය වගේ භාවිතයන් වලදීත් පීඩාකාරී, ගැටුම්කාරී, අසහනකාරී තත්වයන්ට පත් වීම අනිවාර්යයක්.</u> මේ ක්ෂේත්‍රයන්වලදීත් මායා රෝගය අනිවාර්යයක්. පාරභෞතික වීම අනිවාර්යයක්. පුරුෂාර්ථ ඔස්සේ හිතන සමාජ විද්‍යාවට (පුරුෂයින්ට) මේ ක්ෂේත්‍රවලදී ත් ගැහැණු ශරීරය වටහාගන්න බැරිවීමක් අනිවාර්යයක්. බෞද්ධ දර්ශනයේ තියෙන ස්ත්‍රීවාදී ප්‍රතික්‍රියාව තමයි පුරුෂ ශරීරවලට අභිධර්මය කියලා පාරභෞතික වාදය උගන්වන්න උත්සාහ කරපු එක. විශ්ව විද්‍යාලයේදී අභිධර්මයට කියන්නෙ බෞද්ධ මනෝ විද්‍යාව කියලා. ජන ප්‍රවාද වල කියෙන්නේ බුදු හාමුදුරුවෝ මුලින් ම අභිධර්මය දේශනා කලේ තුසිත දෙව්ලොව හිටපු එයාගෙ අම්මට කියලා. ගැහැණු ශරීරය පරිණත නං "ගැහැණියක්" වෙනවා; අපරිණත නම් "තරුණියක්" වෙනවා. මේ වනාහි ගැහැණු ශරීරය පාරභෞතික කරන එක ක්ෂේත්‍රයක්. ගැහැණු ශරීරය අපරිණත ඉඳං පරිණත දක්වා පරිවර්තනය කරන්නේ පුරුෂ ලිංගේන්ද්‍රිය. සංසර්ගයට කලින් තරුණිය-සංසර්ගයට පස්සේ ගැහැණිය. මේක පුරුෂාර්ථවලින් බැම්මක් කරපු යථාර්ථයක්. මොනතරම් විහිළුවක්ද. පුරුෂ ශරීරයකට කීවොත් ඔයා නාමලී නමැති ගණිකාවගේ පිහිටින් ශුක්‍රාණු පහකරන්න කලින් තරුණයෙක්, ඊට පස්සේ පිරිමියෙක් කියල. ගැහැණු ශරීරයක් දන්නවා අප්‍රමාණ බඩවැල් අතර එකක් වුණු යෝනිය ඇතුලට මොකක් හරි දාපු පළියට තමන් පරිණත වෙන්නේ නැහැ කියලා. ස්ත්‍රී සිතුවිලිවලට මේ දැනෙන විදිය. නමුත් පුරුෂාර්ථ අවධාරණය කරන්නේ වෙන දෙයක්. ඔව් පුරුෂ ලිංගේන්ද්‍රිය මැජික් පොල්ලක් කරවන්න තියෙන උවමනාව තමයි ඒක.

## දර්ශණික සංසර්ගය හා ඥාන විභාගය

ඉතිං, ඔන්න සංසර්ගය අතිශය දර්ශනිකයි. සංසර්ගය නිකං ඇරිස්ටෝටල් වගේ. සංසර්ගය නිකං ස්පිනෝසා වගේ. සංසර්ගය නිකං ඩෙරිඩා වගේ. අපි දැන්



හොඳට දන්න දෙයක් තමයි මේ දර්ශනික සංසර්ගය කියන්නේ ගැහැණු ශරීර වලින් කොළේ වහලා සෙල්ලම් කිරීමක් කියලා. සූත්තරය සූත්‍රයක් කිරීමක්. ඔන්න කරුමයේ හැඩරුව හොඳටම පැහැදිලියි. ගැහැණු ශරීර වලට සමාජ විද්‍යාව වටහාගන්න බැහැ; සමාජ විද්‍යාවට ගැහැණු ශරීරය වටහාගන්න බැහැ. සමාජ විද්‍යාවේ මූලික දත්ත ගැහැණු ශරීරවල ඥාන විභාගයට ළඟා වෙන්නේ නැහැ. අනිත් පැත්තටත් එහෙමයි. ගැහැණු ශරීරයක ඥාන විභාගය දර්ශනවාදය වටහා ගැනීමේදී අසමත් කියන්නේ ලෝකය යහපත් ව පවතිනවා කියන එකයි. තමන්ට එරෙහිව තියෙන උපායක් වටහා ගන්න ගැහැණු ශරීරවල තියෙන නොහැකියාව විතරයි. "උඹ මතක තියාගනින් උඹ දැං පොඩි ළමයෙක් නෙමෙයි ලමිස්සියක් " කියලා තාත්තා දුවට කෑගැහුවම මේ පුද්ගලයා මේ තරම් ප්‍රචණ්ඩව ආරක්ෂා කරන්නේ මොකක් ද කියලා මතුවෙනවා. නිරුවත් ඇඳුම වන සාය අතරින් කකුල පෙණුනොත් තාත්තා ඇවිස්සෙන්නේ මොකද කියලා මතුවෙනවා. පිට කවරය තමයි සංස්කෘතිය, හැදියාව. ඇතුල් පැත්ත තමයි දර්ශනික සංසර්ගය, එහෙම නැත්නම් සංසර්ගයේ තියෙන දර්ශනික කම විනාශ නොකරන්න වග බලා ගැනීම, හැමෝටම හොරා සිද්ධ වෙන දේ තමයි ගැහැණු ශරීරවලින් හැකි තරම් ඥාන විභාග ක්‍රියාකාරීත්වය ඈත් කිරීම. නිකමට දුව තාත්තගෙන් හරවලා මෙහෙම ඇහුවොත් "මගේ කකුල කවුරුවත් දැක්කට මට මුකුත් වෙන්නේ නැහැනේ" කියලා, තාත්තට තරහ ගන්නවට වඩා දෙයක් නැහැ. මොකද ඒ ගැහැණු ශරීරයට සිද්ධවෙන කොංගෙඩියක් නැහැ කියලා හැමෝම දන්නවා, සිද්ධවෙන්නේ ලෝකයට-සිද්ධ වෙන්නේ පුරුෂ ලිංගිකත්වයට. මෙන්න මේක ආරක්ෂා කරන්න තමයි පුරුෂාර්ථවලට අනුව ගැහැණු ශරීර නටවන්නේ. ලෝකයේ ඔක්කොම ගැහැණු ශරීර ටික එකම මොහොතක නිරුවතින් පාරේ යන්න තීරණය කළොත් පුරුෂාර්ථවල ප්‍රධාන ඔට්ටු සෙල්ලමක් වාෂ්ප වෙලා යාවි. මේකෙන් හම්බකරපු ව්‍යාපාරිකයෝ ගොඩාක් හිහන්නො වේවි. ගැහැණු ශරීර ඉන්ද්‍රියයන් ප්‍රසිද්ධියේ පෙනෙන එකේ "මහා පාපය" ඕකයි. හිහන්නෝ විකුණගෙන කන ව්‍යාපාරිකයන් ගාව ඉන්නවා ටිකක් ඔළුව ලොකු ළමයෙක්. කොළඹ එක එක උත්සව තියෙන කොට මේ ළමයාව ගෙනි යනවා ප්‍රදර්ශනේට. එතකොට ළමයව තියල තියෙන්නේ පොඩි කුටියක් ඇතුලේ. මිනිස්සු සල්ලි ගෙවලා පෝලිමේ ඉඳලා ළමයා බලලා එනවා. එළියේ ගහලා තියෙනවා "මෙන්න අරුම පුදුම සත්වයා, විශාලකම ඔළුව තියෙන .....". ඉතිං, බලලා එළියට එන අය, එළියේ ඉන්න අයට කියනවා "ඔව් අනේ මාරයි ගිහිං බලන්න" කියලා. නමුත් මේ දරුවා නිකමට කුටියෙන් එළියට එබුනොත් මුළු ව්‍යාපාරයම කඩාගෙන වැටෙනවා. පෝස්ටරයේ අරුත නැති වෙනවා. පෝලිම් නැති වෙනවා. ගැහැණු ශරීරයටත් පුරුෂාර්ථ කරලා තියෙන්නෙ මේකමයි. මේක හරි සරල සෙල්ලමක්. නිදසුනකට අපට නිතර දෙවේලේ පෙනෙන අලියා කියන සතාව බලන එක තහනම් කරලා විශේෂ ස්ථානයක කොටු කළොත්, මිනිස්සු පෝලිම් ගහලා ටිකට් අරගෙන බලන්න යාවි. මෙන්න මේ කිරිඩාව දුව නොදන්නවට තාත්තා දන්නවා. ඒකනේ සමාජය කියන්නේ ගැහැණු ශරීරය හැම මොහොතකම පුරුෂ ශරීරවලින් උපදෙස් ගන්න ඕනේ කියලා. ඇයි හිතුමතාපෙ හැසිරිලා පුරුෂ බිස්නස් එක කඩලා දැම්මොත්, ඒ දුවව "හදාපු" (අඹාපු) තාත්තට දොස් අහන්න වේවි, "අවලං" දුවෙක් හැදුවා කියලා. මේවා කටවත් ගැටළු නෙමෙයි, අපි මේවා ගැටළු කරගන්න ඕනෙත් නැහැ. අපි වෙන අතක් බලමු.

අර කූඩිය ඇතුලේ ඉන්න දරුවගේ මළුවට මොනවද දැනෙන්නේ, ජීවිතයට මොනවද දැනෙන්නේ, අනුන්ගේ අවශ්‍යතාවක් වෙනුවෙන් තමන්ගේ මුළු විශ්ව සම්බන්ධයටම (තමන් ඉඳගත යුත්තේ කොහොමද, තමන්ගේ ශරීරයේ කුමන කොටස් කාට පෙන්විය යුතුද– කාට නොපෙන්විය යුතුද, හිනාවිය යුතු හඬ පාලනය, කුණුහරුප අකර කුණුහරුප නැතිව යේ,.....) නීති පැනවිලා තියෙන කොට ස්ත්‍රී සිතුවිලිවලට මොනවා සිද්ධ වෙනවා ඇත්ද? මේ තත්වය අපට "තේරුම්" ගන්න පුළුවං කියලා හිතුවට ඇත්ත තත්වය ඒක නෙමෙයි. මොකද මේ තත්වය තේරුම් ගන්න අපට සංකල්පවත් නැහැ. මේක නිකං එක්තරා කුලයක්, එක්තරා මිනිස් කැලක්, රටක් අඛණ්ඩව අවුරුදු දහස් ගණනක සිර දඬුවමකට යටත් වෙලා වගේ. හැම ගැහැණු සිතුවිල්ලක්ම දන්නවා මේ නිර්දය කහනම් නීති රීති තමන්ගේ ආච්චිට, අම්මට, දුවට එක වගේ බලපවත්වනවා කියලා. මෙන්න මේ නිසයි පුරුෂාර්ථවලට හොරා යන "ගැහැණු අධ්‍යාපනයක්" ලෝකයේ පවතින්නේ. ඉතිං, අම්මලා දූලාට කියලා දෙනවා යහපත් හිරකාරයෙක් වෙන විධිය. සිරගෙදර ජීවිතය තුල වැඩියෙන්ම අයිතිවාසිකම් දිනන ක්‍රමය. මාසික ඔසප්වල රෙදි හොරාට වේලන විධිය. කොටින්ම බෙහෙත් ගන්න මට්ටමට ලෙඩෙක් නොවී "ලෙඩ ජීවිතයක්" ගෙවන ක්‍රමය තමයි මේ "ගැහැණු අධ්‍යාපනයේ " අඩංගු වෙන්නේ. ඉතිං, දූවරු පිළිබඳ මාතෘකාවේ දී විප්ලවවාදී අම්මලා නැහැ.

ආයෙමත් අපේ ප්‍රදේශය තමයි ස්ත්‍රී සිතුවිලි වලට මොනවද වෙන්නේ. ගැහැණු ශරීරයේ ඥාන විභාගය කියන්නේ මොකක්ද? ගැහැණියකගේ දැනුම හැදීමේ දිගයි නමැති නිරීක්ෂණය පුරුෂ සත්‍යයක්. මොකද, ගැහැණු ශරීරවලට සමාජ විද්‍යාවක් නැහැ. (ගැහැණු ශරීර කුඩුවේ සජීවී ව ක්‍රියාකාරී මොලයක් නැහැ කියලා හිතන එක පුරුෂ මොලගෙඩිවල ආබාධයක්, ඒක එහෙමම තිබුණාවේ) සමාජ විද්‍යාව කියන්නේ පුරුෂ සමාජයේ (දර්ශනික සමාජයේ) විද්‍යාව නම් ඒ ප්‍රදේශය හැම අතින්ම කහනම් ගැහැණු ශරීරවලට. ඒ විද්‍යාව ඥාන විභාගයට ළඟා වෙන්නේ නැහැමයි. අතික ඒක ඉගෙන ගැනීමෙන් ගැහැණු ශරීරයකට දැනගන්න පුළුවන් උපරිමය තමයි පුරුෂ ශරීර වනාහි "මොනවාද" කියන එක. ගැහැණු ශරීරවලට වෙන වැඩක් නැද්ද? සරලව කීවොත් ගැහැණු ශරීරයක ඥාන විභාගයට සමාජ විද්‍යාව කියන්නේ තමන් "පුරුෂ ජීවිතයක් ගෙවන තරමට" තමයි.

දැං අපි ටිකක් ප්‍රවේශමෙන් මේ කාරණය හඳුනා ගනිමු. ගැහැණු ශරීර සමාජ විද්‍යාව වටහා ගැනීමේදී මන්ද බුද්ධිකත්වයක් ප්‍රකට කරනවා. කොටින්ම පුරුෂ ශරීර වගේ දර්ශනිකයෝ නෙමෙයි, "ගැහැණු" සමාජ විද්‍යාඥයෝවත් නැහැ. පුරුෂ චින්තනය (අනිවාර්යයෙන්ම පුරුෂ සමාජ විද්‍යාවෙන් මෙහෙයවන) අනුව මේ "නොහැකියාව" ගැහැණු ශරීරවල ජීව විද්‍යානුකූල අප්සෙට් එකක්. නිකං ඉන්ද්‍රියන්වල අප්සෙට් එකක් වගේ. පුරුෂ චින්තනයෙන් හඳුනගන්න මේ "ආබාධය" ඉන්ද්‍රිය අර්බුදයක් නෙවෙයි: භාවිතයේ අර්බුදයක්. ගැහැණු ශරීරයකටත් සංසර්ග කේන්ද්‍රීයව සමාජය බලවන්න පුළුවන් නම් (මේක කරවන්න බැරි වැඩක්) අන්න ඒ ගැහැණු ශරීරයට සමාජ විද්‍යාව සිම්පල් විෂයක් වේවි. පවතින තත්වයේ දී ගැහැණු ශරීරවලට වෙලා තියෙන්නේ සමාජ ගත නොවී සමාජ විද්‍යාව හදරන්න: හරියට වතුරට බහින්න තහනම් කරලා පිහිනීම ඉගෙන ගන්න බල කරනවා වගේ.



සමාජ චින්තනය සංසර්ග කේන්ද්‍රීය වෙලා තියෙන්නේ මේ වගේ එක තලයකින් නෙමෙයි. තවත් තලයන්වල එහෙම වෙනවා. තාර්කික චින්තනයේ ආකෘතිය බලන්න; ගැටළු නිසා පිළිතුරු. ප්‍රතිවිරෝධයන් නිසා උත්තේජනය. සංසර්ගය නිසා ශුක්‍රාණු පහවීම. උත්තේජනය නිසා පුරකන්කය. නොදන්නවා යැයි "දන්න" නිසා හෙවීම. කොටින්ම අසහනය නිසා..... හීනමානය නිසා..... අපි හොඳටම දන්නවා සමාජ විද්‍යාවත් ක්‍රියාත්මක වෙන්නේ මේ ආකෘතියෙන්, මේ දිශාවට. සංසර්ගයත් ක්‍රියාත්මක වෙන්නේ මේ ආකෘතියෙන් මේ දිශාවට. ගැහැණු ශරීර වලට ලිංගික අසහනය කියලා සංකල්පයක් නැහැ. උපරිමය තමයි "පංති හීනමානයක්" පවතින්න පුළුවන් වීම. ඉතිං ,ගැහැණු ශරීරයට ලිංගිකත්වය ගැන චින්තනයක් නැහැ: මේ ක්ෂේත්‍රයේදීත් පුරුෂයින්ට "උවමනා" වුනාට ගැහැණු ඥාන විභාගය වියුක්ත සිතුවිලි ඉක්මවන්නේ නැහැ. අතික් අතට සමාජයට ආවත් ගැහැණු ශරීරවලට දර්ශනික හීනමානයක් නැහැ. ඇයි දර්ශනිකයෝ ටික කෙළ හලාගෙන තමන්ගේ සිරුර ළඟ වැටෙනවනේ. මෙන්න මේ නිසා පුරුෂාර්ථ අනුව බැලුවත් ගැහැණු ශරීරයක ඥාන විභාගයට සංසර්ග ආකෘතියක් දීගන්න බැහැ; ගැහැණු වනාහි බැරි කමෙයි නැති කමෙයි සංකේතයක්!

## ෆ්‍රොයිඩ් කියලා පුරුෂයකුගේ මනෝවාදය

යෝනි මාර්ගය හිස් ඉඩක් කියලා තමන්ගේ හැඟීම පෙන්වන්නේ නැතිව ෆ්‍රොයිඩ් කියුවා ගැහැණු ශරීර කියන්නේ අඩුවට, හිස්කමට, නැතිකමට කියලා. එක පැත්තකින් ෆ්‍රොයිඩ්ට වැටහෙන්නේ නැහැ එයා පුරුෂාර්ථවලට බිලිවෙලා තමයි ගැහැණු ශරීරය දිහා බලන්නේ කියලා. ඔව්! ඒ අනුව බැලුවම ගැහැණියකුත් නැහැ ගැහැණු ලිංගිකත්වයකුත් නැහැ. ඉතිං, පුරුෂ ලිංගේන්ද්‍රිය නිසා තමයි ගැහැණුන්ට ලිංගිකත්වයක් (ඒ කියන්නේ "නැති" දේ "ඇති" කිරීම) පවා ලැබෙන්නේ. මේවා කාටද කියන්නේ; අපි ගැහැණු ගැහැණුම කියාගනිමු. පුරුෂ ශරීර පාරභෞතික වී විශාල පුවයක් ලබන සිතුවිල්ලක් තමයි මේක: ගැහැණු ශරීරවලට "ජීවිතය" පවා ලැබෙන්නේ සංසර්ගය නිසා. කාටදැ ආඩම්බර; පුරුෂ ලිඟුවට නොවැ. ඉන්ද්‍රියානු කියමනක් තියෙනවා පුරුෂයාගේ ජීවිතය අවසන් වෙන්නේ විවාහයෙන්, ගැහැණියකගේ ජීවිතය ආරම්භ වෙන්නේ විවාහයෙන් කියලා. මේවා කට කහනවට කියාපුවා නෙමෙයි. පුරුෂ ලිංගේන්ද්‍රියට අරුතක් දෙන්න ඕන නිසයි යෝනි මාර්ගය හිස් ඉඩකක් කරන්නේ. අපි ෆ්‍රොයිඩ්ට කියමු එයාගේ ලිංගික දෘෂ්ටියෙන් ටිකරක් නොබලා තවත් කිට්ටුවෙලා යෝනිය බලන්න කියලා. හරස් අතට බැලුවොත් යෝනිය දිගටි ඉන්ද්‍රියක්. හරියට අතක් වගේ. අත අස්සට පුරුෂ ලිංගේන්ද්‍රිය ඔබා ගැනීමේ "අරුතක්" පුරුෂාර්ථවලට නැති නිසා දැනෙන්නේ නැහැ අතෙත් කුහරයක් තියෙනවා කියලා. යෝනිය ශරීරයෙන් පිටට පෙනෙන තැන ඒක පිටට නෙරාපු ඉන්ද්‍රියයක්. පුරුෂාර්ථ වලින්ම කියනවා නම් පුරුෂ ලිංගේන්ද්‍රියකට වඩා නිර්මාණාත්මක ඉන්ද්‍රියයක්. එක එක ක්‍රියාකාරීත්වයන් තියෙන ඉන්ද්‍රිය කොටස් කිහිපයක් එළියට නෙරලා තියෙන්නේ. හරියටම පුරුෂාර්ථවලින් කියනවා නම් පුරුෂ ලිංගෙන්ද්‍රියන් විශාල එකකුයි පොඩි හතරකුයි තව දේවලුයි..... වගේ. ඊළඟට ශුක්‍රාණුවල හැකියාව කථා කරනව නං යෝනියට පුළුවන් දියර වර්ග පහක් විතර නිකුත් කරන්න. මෙතන දී ෆ්‍රොයිඩ් කියාවි යෝනියට ඇඟිල්ලෙන් ඇනලා මෙන්න නොපෙනුනාට කුහරයකුත් තියෙනවා කියලා. අපි බෝල්පොයින්ට් කුර දල පෙන්වනවා මෙන්න ශිෂ්ණයෙත් කුහරයක් තියෙනවා

කියලා. ඉතිං, මේ මනෝ විද්‍යාව මොකක් ගැනද, සංසර්ගය ගැන මනෝ විද්‍යාවක් ඒක. පුරුෂ ලිංගේන්ද්‍රියට අරුතක් හදන්න ආපු මනෝ විද්‍යාවක් ඒක.

ෆ්‍රොයිඩ්ගේ දේවල් මඩේ දල හෝදපු ලකාන් කියන මනුස්සයා කීවා ගැහැණිය කියලා එකක් නැහැ කියලා. මේ ප්‍රකාශය පිටිපස්සේ ලකාන්ගේ වුවමනාව මොකක්ද?

* පුරුෂාර්ථවල නැති ගැහැණිය නැතිම කරලා දන්න.

* ගැහැණු ශරීරය සම්බන්ධ මේ "නැහැ" සංකල්පයෙන් සංසර්ගයටයි පුරුෂ ලිංගේන්ද්‍රියටයි "තියෙනවා" අරුතක් ලැබීම.

* අද පවා සංසර්ගයට උචිත "ගැහැණුත්ව" හදනවා කියන එක (දුවක් හැදීම) අමතක කරවන්න.

ගැහැණු ශරීරවලට කියන්න තියෙන්නේ පුරුෂ සමාජයේ මනෝ විද්‍යාව වටහාගන්න නම් කල්පනාකාරීව ෆ්‍රොයිඩ්ගේ දේශනා හැදෑරිය යුතුම බවයි. තවත් සමීප විධියකට කියනවා නම් තමන් භාංකාවාසියක් නොදන්න ගැහැණු ශරීරයක් එක්ක ලේබල් ගහලා තියෙන මේ නැතිකම, හිඟකම ගැන දැනගන්න තිබෙන ප්‍රවීනම විෂය තමයි පුරුෂ මනෝ විද්‍යාව. ගැහැණු සිතුවිලි අනුව ගැහැණු ශරීරයක් පරිපූර්ණයි. ඒකට කිසිම අඩුවක් නැහැ. එහෙත් පුරුෂ ඉන්ද්‍රියන්වලට, සංසර්ගයට අරුතක් හදගන්න පුරුෂ ශරීර "ආගමක" ඉන්නවා තමන් වගකිවයුතු ගැහැණුන්ගේ "අඩුවක්" තියෙනවා කියලා. ඔක්කොම ඉතිං ශුක්‍රාණු පිටවෙනකම් විතරයි, ඒ වුණත් මේ ආගම ගැන තිසීස පුරෝජු විෂයක් තමයි පුරුෂ මනෝ විද්‍යාව. එංගල්ස් කියන එක්කෙනා කීවා දෙවියන් වහන්සේ බළල්ලු මැව්වේ මීයෝ අල්ලන්නලු, මීයෝ මැව්වේ බළල්ලු ලවා අල්ලවන්නලු. මේ දෙවර්ගය මැව්වේ දෙවියන්ගේ වැඩ පෙන්වන්නලු. ඒත් දෙවියන්ගේ වැඩ කිඩ ගැන එංගල්ස් නොදන්න වාක්‍යයක් තියෙනවා. ඒ තමයි, දෙවියන් වහන්සේ ආදම්ව මැව්වේ සම්පූර්ණත්වය පෙන්වන්න. ඒවව මැව්වේ අඩුපාඩුව හෙවත් අසම්පූර්ණත්වය පෙන්වන්න. සර්පයාව මැව්වේ ඒවගේ අසම්පූර්ණත්වය මතක් කරවන්න. ඇපල් මැව්වේ ඒවගේ අසම්පූර්ණත්වය විසඳලා ආදම් සුපිරි විධියට සම්පූර්ණ කරවන්න. දෙවියන්වහන්සේ ගත්තත් ෆ්‍රොයිඩ්ව ගත්තත් වැඩ පෙන්වන්නේ සංසර්ගයෙන්ම තමයි. ආදම් ඇපල් ගෙඩිය කාපු එක එළිවුණොත් කාට කාටත් අමාරුවේවි.

## වාහන දැකීමෙන් ලිංගික උත්තේජනය

උත්තේජන - ප්‍රතික්‍රියා ක්‍රමයෙන් ගැහැණු ශරීර ක්‍රියාත්මක වෙන්නෙම නැහැ. මේකු පුරුෂ සමාජයේ චලන ස්වරූපයක්. එහෙත් ගැහැණු ශරීරයේ එකම එක සුළු භාවිතාවක් තියෙනවා, මේ පුරුෂ චලන ස්වරූපයට අනුගත වුණු.

ගැහැණු ශරීරයට සමාජය නිසා ලිංගික උත්තේජනය ලබන්න පුළුවන් එකම එක කලාපයක් තියෙනවා. ඒ තමයි "පංති හීනමානය" ගැහැණු ශරීරයට කරන දේ. සමාජ ඉතිහාසය ගැහැණු ශරීරයට පරිත්‍යාග කළ එක ජානයක් මෙතන මුණ ගැහෙනවා. පුරුෂයෙක් නිශ්චිත ගැහැණියකගේ පංති තත්වය ඉව කරන්නේ ඒ ගැහැණියගේ ශරීරයෙන්. එහෙත් ගැහැණියක් නිශ්චිත පුරුෂයකුගේ පංති තත්වය



ඉව කරන්නේ ඒ පිරිමියාගේ දේපළ වලින්. ගැහැණියකට එයාගෙ ශරීරය පංතියෙන් ඉහළට ඔසවන්න කරන වෑයමේදී ප්‍රධාන ගැටළුව වෙන්නේ ආර්ථිකය. ඉතිං, ආයෙමත් හරවලා පංති හීනමානයමයි, මෙන්න මේ හීනමානය නිපදවන සමාජ විද්‍යාව ආයෙමත් පුරුෂයින්ට ම ප්‍රශස්තියක් වෙනවා. පුරුෂ සමාජයේ ශරීරය, පංතියෙන් ඉහළට ඔසවන එක පිරිමි වැඩකට වඩා "ගැහැණු වැඩක්"; වැදගත් කාරණය දේපළ ඉහළට ඔසවන එකයි.

ගැහැණුන්ට එක ස්ථානකුයි, පිරිමින්ට එක ස්ථානයකුයි දුන්න සමාජ විද්‍යාව හරිම යහපත් විධියට දළු දනවා; හරියට කාම සූත්තරය වගේ. ඉතිං, වාහනයක් අරගෙන පෙම්වතිය බලන්න යන පිරිමියා දන්නවා, පෙම්වතියට වාහනයත් එක්ක "ලිංගික උත්තේජනයක්" තියෙනවා කියලා. ඒ එක්කම පෙම්වතිය දන්නවා "වාහනය එක්ක ඉන්න පෙම්වතා" ගැන ලිංගික උත්තේජනය ගැහැණු ශරීර වලට "ස්වාභාවිකයි" කියලා. මේ අමනුස්ස සමාජ විද්‍යාවයි, සමාජයයි නොදන්න දේ තමයි වාහනය ලිංගික උත්තේජනයේ උපකරණයක් කියලා ගැහැණු ශරීර නොදන්න එකයි, ගැහැණු ශරීර ඒක නොදන්න බව පුරුෂ ශරීර නොදන්න එකයි.

මල්ලි කෙනෙක් පෙම්වතියව හමුවෙන්න යනකොට අක්කගේ ඔරලෝසුව ඉල්ල ගෙන යනවා. නමුත් අක්කට මතු වෙන්නේ නැහැ මේ ඔරලෝසු රැවටීම මගේ පෙම්වතත් මට කරනව ඇති කියලා. එයාගෙ පෙම්වතියගේ මල්ලිත් ඔරලෝසුව ඉල්ලන නිසා "හොරේ" අහුවෙයි කියලා මල්ලිට ප්‍රශ්නයකුත් නැහැ. කොටින්ම මෙතන කිසිම "රැවටීමක්" නැහැ. අක්කා මල්ලි එකතුවෙලා කරන්නේ කාම සූත්තරය වගේ "ස්වාභාවික" ක්‍රියාවක්. ඉතිං, ට්‍රේල් බයිසිකල්, කාර් එකතුවෙලා ලිංගික සංසර්ගයේ යෙදෙන එක අපේ ලෝකයේ බොහෝම ස්වාභාවික ක්‍රියාවලියක්.

ඉතිං, ගැහැණුන්ගේ "ලිංගික අසහනයකට" පුංචිම ඉඩක් තියෙන ස්ථානය තමයි පංති හීනමානය.

පමණට වඩා වියුක්ත කරලා අනාත නොවෙන්න වග බලාගන්න සිදු වුණාට අපිට අනිවාර්යයෙන් පරීක්ෂා කරන්න තව ස්ථාන කිහිපයක් තියෙනවා.

ආයෙමත් වතාවක් ගැහැණු ශරීරවල ඥාන විභාගයට මොකද වෙන්නේ. ලිංගික අසහනය නිසා තමන්ගේ ලෝකයේ ප්‍රේමය බිලිදෙන එක නොදන්න පුරුෂ ශරීරවලට සමානුපාතිකව, දේපල නිසා තමන්ගේ ශරීරය බිලිදෙන එක ගැහැණු ශරීර දන්නේ නැහැ. තමන්ගේ ශරීරයෙන් ලෝකයේ විශාලතම පරිත්‍යාගය කරලා දේපල-ආර්ථිකයට පදනමක් දෙන ගැහැණු ශරීරයට, හරවලා ඒ දේපල-ආර්ථිකයම කිසිම පලක් නැති කොට එවැනි ශරීරයක ඥාන විභාගයේ සැපදුක් කොහොමද? පාරභෞතිකවාදයකට වඩා දෙයකට මෙතන ඉඩක් තියෙනවද? මෝහිනීලා, උමයංගනාලා ලෝකයට මදිවෙන එක අනිවාර්යයක්. කොහොම හරි අපේ යුගයේ ලිංගික සංකේතය වනාහි බඩට කෑමක් නැති, ලෙඩෙක් තරම් ඇට පෑදුණු, කොණ්ඩේ කඩා දපු නියුරෝසියානු ගැහැණියක්. සමාජවාදී විප්ලවයෙන් අපට ඇති මඟුලක් නැහැ කියලා ගැහැණු ශරීර හඬනගා කියන කොට එතන තියෙන සත්‍යයන් ගැන අද සමාජ විද්‍යාව විග්‍රහ කළාම සිද්ධ වෙන්න පුළුවන් විකාර විතරයි. වෙනත් විධියකට කියනවා නම් පුරුෂ ශරීර සම්බන්ධතාවලින් මිදෙන ගැහැණු ශරීර

බොහෝමයක් දේපල ආර්ථික සම්බන්ධතා වලිනුත් මිදීම විස්තර කරන්න සමාජ විද්‍යාවට බැහැ.

අපි නිදසුනකට D නමැති ගැහැණු ශරීරය ගනිමු. ආර්ථිකවාදී පුරුෂ ශරීරයක් එයා ප්‍රාර්ථනා කරනවා. ආර්ථිකයට A කියමු. පුරුෂ ශරීරයට P කියමු. එතකොට D හිතනවා තමන්ගේ පුතා P ට පංතික D කෙනෙක් අල්ලගන්න P ටත් A තිබිය යුතුයි කියලා. එතකොට තමන්ගේ දුව D ට A තියෙන P කෙනෙක් (පුරුෂ බැනා) අල්ලා දිය යුතුයි. D වන තමන් අනෙකක් වුණු P එක්ක ලිංගික සම්බන්ධකම මැදට A නමැත්ත "පිවිත්" රිංගන එක වටහා නොගෙන, D විසින් ඉහත සඳහන් චක්‍රය හඳනවා කියන්නේ ඓශ්වර්යයක්. ඇත්ත තත්වයේ දී කිසිම විසංයෝජනයකින් තොරව මේ සමාජ විද්‍යාවට, චක්‍රයට ගැහැණු ශරීර කිලිවෙනවා. පාරභෞතිකවාදය හැරෙන්න හඳුනාගන්න, වටහාගන්න, හිතන්න ගැහැණු ශරීරයකට චක්‍රයෙන් ඉඩක් නැහැ. ඉතිං, ගැහැණු ශරීරයකට ස්වාභාවිකවම සමාජ විද්‍යාව අකැපයි නම්, ලිංගිකත්වයේ දී පංති හීනමානය සහිත ගැහැණු ශරීරවලට සමාජ විද්‍යාව හොඳටම අකැපයි. මේ සුවිශේෂ බාධාව මෙහෙම රූපික කරන්න පුළුවන්.

$$D \longrightarrow A \longrightarrow P$$

## සමාජ විද්‍යා විරෝධය හා සිතීම

මිනිස් ශරීරය තමන්ගේ බාහිරයත් එක්ක පවත්වන, එක සජීවී සම්බන්ධයක් තමයි "හිතීම". හිතීම කියන්නේ ඇතුලත සිට පිටත, නැතිනම් පිටත සිට ඇතුලත්. ඇතුලත ඇතුලත කියලා හිතීමක් නැහැ. ඇතුලත තියෙන පිටතදේත්, ඇතුලතදේත් තමයි උපරිම.

අපේ කාරණාව මෙකයි. පුරුෂ ශරීරයක "හිතීම" බහුතරයක් සමාජ විද්‍යාත්මකයි. එහෙමත් නැතිනම් සමාජ විද්‍යාව බවට පරිවර්තනය වෙමින් පවතින දේවල්. එහෙත් සංසර්ග කේන්ද්‍රීයව පවතින්න බැරි ගැහැණු ශරීරවලට සමාජ විද්‍යාවක් නැහැ. එතකොට ගැහැණු ශරීර "හිතන්නේ" නැද්ද? හිතනවා, හැබැයි සමාජ විද්‍යාත්මකව නෙමෙයි. සමාජ විද්‍යා විරෝධීව. එහෙමත් නැතිනම් දුර්වල සමාජ විද්‍යාත්මකව. ඉතිං, ඕනෑම දෙයක් ගැන පිරිමි ඇහැ හා ගැහැණු ඇහැ අනිවාර්යයක්. ඕනෑම ක්‍රියාවක් ගැන ගැහැණු මතයයි පිරිමි මතයයි කියලා දෙකක් පවතින්නේ එහෙමයි. ගැහැණු ශරීරවල මේ සමාජ විද්‍යා විරෝධී සිතීම සමානුපාතික සමාජ විද්‍යාවේ ධන-ඍණ ඵලයත් බෙද ගන්න හැටිත් සමාජ සමානුපාතිකයි. සමාජ විද්‍යාව පන දෙන අළුත් තත්වයන්වල දුර්වලතාවයන් හෙවත් දුෂ්ටත්වයන් මුලින්ම දැනෙන්නේ ගැහැණු ශරීරවලටයි. පුරුෂ ශරීර මෙතනදී ප්‍රමාදයි. සමාජ විද්‍යාව පන දෙන අළුත් තත්වයන්, විශිෂ්ටතාවයන් හෙවත් ජීවයන් මුලින් දැනෙන්නේ පුරුෂ ශරීරවලට. ගැහැණු ශරීර මෙතනදී ප්‍රමාදයි.



යම් ගැහැණු ශරීරයකට සංසර්ග කේන්ද්‍රීයතාව පිළිගන්න පුළුවන් නම්, වටහාගන්න පුළුවන් නම් ඒ ගැහැණු ශරීරයට සමාජ විද්‍යාත්මකව හිතන්න පුලුවන්. අඩු තරමින් තමන්ගේ කැමති කලාපය කෙසේ වුනත් අකමැති කලාපය මෙහෙයවන මෙවලමක් වශයෙන්වත් එවැනි ගැහැණු ශරීරයකට සමාජ විද්‍යාව සමීප වෙනවා. මධ්‍යම පංතික ගණිකාව මෙවැනි ගැහැණු ශරීරයක්. පතිව්‍රත්ත විරෝධී, ආර්ථිකය වෙනුවෙන් ඕනෑම කෙනකුට ශරීරය විකිණීමට විරෝධී, කොට්න්ම සම්ප්‍රදාය විරෝධී මේ ගැහැණු ශරීර තමන් "කැමති" ඕනෑම පුරුෂයෙක් සමග ආර්ථික වාසි වෙනුවෙන්/නොවෙනුවෙන් ලිංගික සංසර්ගය ඉවසනවා. තමන්ගේ මුළු පැවැත්මම සංසර්ග කේන්ද්‍රීයයි කියලා හොඳටම "දන්න" මේ ගැහැණු ශරීර හිතන්නේ සමාජ විද්‍යාත්මකවයි. මෙවැනි ගැහැණු ශරීරයක් අනුව පතිව්‍රත්තාව වනාහි "ගැහැණු මෝඩකමක්". පුරුෂ ලිංගිකත්වය වනාහි නටවන්න පහසුම සංසිද්ධිය. ජීවිතය වනාහි පුරුෂ සමාජයේ ගැහැණු ශරීරයේ ස්ථානය.

සමාජ විද්‍යාවත් නැතුව ගැහැණු ශරීරයක් හිතනවා කියන්නේ අළුත් ආරම්භයකට. ඒක ඉතිහාසයේ කොහේවත් හොයලා පෙන්වන්න පුළුවන් දෙයක්, තත්වයක් නෙවෙයි. අළුත් ව්‍යාපෘතියේ අධ්‍යාපනය අපට අතීතයෙන් ගන්න පුළුවන්, ගන්න වෙනවා. අතීත අනිවාර්යයෙන්ම ඒ අධ්‍යාපනය පවා තියෙන දෙයක් නෙවෙයි, අළුත් අර්ථකථන ව්‍යාපාරයක නිෂ්පාදනයන්. ඒ අතින් අළුත් කාරණය පරණ එකක්. ඉතිං, ආයෙමත් මේ මොනවද! කිබුණු දර්ශනවාදයේ ආධුනික ස්ථාන. කිබුණු දර්ශනවාදයේ බොළඳ නිමේෂයන්.

අපි මේ විදියට හිතමු. යෝනි මාර්ගය තව දුරටත් රහසක්, හැංගිය යුත්තක්, කිරණාත්මක නිමිත්තක්, අඩුපාඩුවක්, කුණුහරුපයක්, හුත්තක් කියන සමාජ විද්‍යාත්මක සංඝටක අත් හැරලා හිතන ගැහැණු(පිරිමි) ශරීරයක් කොහොමද ගැහැණු ශරීරයක් හඳුනගන්නේ. එතැන හරවල ආයෙමත් කියැවෙන්නේ ගැහැණිය කියල යමක් නැහැ කියලයි. (මේකමයි මනෝ විශ්ලේෂණයටත් ගහපු හෙනේ) මේ වගේ ම තව මානයක් තමයි අර්ථය තුළ ගැහැණු ශරීරය නැතිනම් අනිවාර්යයෙන් පිස්සුව තුල ගැහැණු ශරීරය සොයන්න වීම. මේ පුරුෂ අර්බුදය අපි හඳුන්වමු "පුකුගේ ගැටළුව" කියලා. ඒක අපි තව චුට්ටක් එහාදී සළකලා බලමු.

අර්ථය පිස්සුවට සාපේක්ෂ කළාම නේද අර්ථය නොවන දේවල් පිස්සුව වෙන්නේ. එහෙමත් නැතිනම් පිස්සුව අර්ථයට සාපේක්ෂ කළාම නේද පිස්සුව නොවන දේවල් අර්ථය වෙන්නේ. සමාජයීය අර්ථය නොවන තත්වයන් තවත් සන්දර්භයක අර්ථයක් කියලා හිතන්න අපිට බැරි වුණේ ඇයි! අධිකාරවාදයට සාපේක්ෂ බහුත්වවාදය අධිකාරවාදයෙන් ගොඩක සහජීවන වුණේ කාගේ වරදින්ද! සමාජය පැත්තක දලා අපේ ජීවිත දිහා බැලුවම මහ දවල් වගේ මතුවෙනවා අර්ථය නොවන දේවල් අපේ ජීවිත ඇතුලේ මොනතරම් අර්ථවත්ද කියලා. ඒත් අපි කැමතියි (බලකෙරිලා තියෙනවා) ඒවාට විකාර කියන්න. ඉතිං, මොනවද මේ ප්‍රකට වෙන්නේ. සමාජ ආයතන ගත නොවන සිතුවිලි වලට පනත් නැහැ, හයියකුත් නැහැ, ආත්මයකුත් නැහැ, ඉතිහාසයකුත් නැහැ, ඒ නිසා පැවැත්මකුත් නැහැ. මේ අරුතින් ගත්තම පිස්සන් කොටුවේ ආරම්භය කියන්නේ එක්තරා මර්දන ඉතිහාසයක ආරම්භයට වඩා එක්තරා අනේකත්වයක් ආයතන ගතවීමේ ආරම්භය. මෙහෙම හිතමු.

එකම විධියක ලිංගික සංසර්ගය නොවන අයව කොටු කරලා 'ලිංගිකයන්' කොටුව කෙරෙව්වොත්. කඳුළු නැති අය ප්‍රධාන කරලා 'කඳුළු සලන්නන්ගේ' කොටුව කෙරෙව්වොත්. අලි මරවන්න වගේ හයිය සපත්තු අර්ථය කරවලා 'සියුම් සපත්තු අඳින්නන්ගේ' කොටුව කෙරෙව්වොත්. ඔන්න පැහැදිලිවම පේනවා එක ආකෘතියක පිස්සන් කොටු නොසෑහෙන හැටි. පිස්සු වර්ග කෝටියක් ආයතන වීමේ උවමනාව මතුවෙනවා. කොටින්ම පුංචි අර්ථයට මෙහෙයව ගන්න, පාලනය කරගන්න බැරි තරමට විශාල ප්‍රමාණයක පිස්සන් කොටු උවමනා කෙරෙනවා. ඔව්! එක ශරීරයක තියෙන සමාජ විද්‍යා විරෝධී සිතීම පාලනය කරන්න පුරුෂ ශරීරයකට පුළුවන් වුණාට අනාගතයේ දී සමාජ විද්‍යා විරෝධී සිතීම් සහිත ශරීර කිහිපයක පාලනය එක පුරුෂයෙකුට ගියොත්..... ඔන්න මෙතැනදී අපිට එංගල්ස්ට කෙලින්ම අමතන්න පුළුවන්. "හිතවත් එංගල්ස් ඔයාගෙ සමාජ විද්‍යා කථාව අනුව ඒක භාර්යා ව්‍රතය සඳහා ඕන කරන්නේ පෞද්ගලික යෝනි මාර්ගයක්. ඔන්න අපි ආකෘතියක් හදනවා පෞද්ගලික පුරුෂ ශුක්‍රාණුව කොටු කරන්න. එතැනත් දරුවගේ පියා සහතික වෙනවා. හැබැයි ඒ පවුලේ ගැණු ගොඩයි. ඔන්න ඔතැනින් එහාටත් එංගල්ස් ඔයා එක ස්ත්‍රියකට නීති හැදුවොත් අපි ඔයාගේ සමාජ විද්‍යා කථාව සැක කරනවා." අනික සමහර අවස්ථාවල දහස් ගණන් පවා ගැහැණු ශරීර හිටපු අන්තඃපුර පාලනයේ දී පුරුෂ ශරීරයක් මොනතරම් නීති රීතිවල -මර්දන ආයතනවල පිහිට පැතුවද කියන එකත් හෙළි වෙනවා.

## ස්ත්‍රීවාදය = පාරභෞතිකවාදය

මේ මාතෘකාව විස්තර කරන්න අපේ යුගයේදී කිසිම ටීකාවක් අවශ්‍ය නැහැ; නහයේ ඇතිල්ලෙන තරමට අනුභූතිකව මේක මතුවෙලා ඉවරයි. ඒ වුණත් පාරභෞතිකවාදය පවක් හැටියටත් ස්ත්‍රීවාදය වාසනාවක් හැටියටත් වෙන්කරන උපාය මතුවෙන්නේ කොහෙත්ද!

විලාසිතාවන් ගණනාවක් ඇතුලේ මේ උපාය ගැටළුවක් වශයෙන් ප්‍රකාශ වුණු අවස්ථා ගොඩාක් තියෙනවා. එහෙත් ඒ විලාසිතාවන් වලට පන දෙන්න අපේ අසහනයක් නැති තැන යුගයට ගැලපෙන විධියට වියුක්තව දේවල් මතුකර ගනිමු. පවතින සමාජයේම "මාතෘකා" කිහිපයක් ස්ත්‍රීවාදයත් එක්ක ගැටුණු හැම සැරේම ස්ත්‍රීවාදය කැලතිලා ගිය ඉතිහාසයක් තියෙනවා. කැලතිලා කීවේ ඉලක්ක, විධික්‍රම, සටන් උපායන්, විලාසිතාවන් මේවා වෙනස් වුණා. නිදසුන් මාතෘකා තමයි මාතෘත්වය, භාෂාව, ලස්සනත්වය, මාක්ස්වාදය, (සංසර්ග කේන්ද්‍රීය) ද්විලිංගිකත්වය, පවුල..... යනාදී වශයෙන්.

සමාජ විද්‍යාවක් නැති, ආයතන නැති, සම්ප්‍රදායක් නැති ස්ත්‍රී ලෝකයක ආවේග, සිතුවිලි ආවාම හැම මානයකම ගැටුම් අනිවාර්යයක්. ඒ වුනත් ඒ ගොඩාක් ගැටුම්වල මූලික සාධකය අත් හරින්න පහසුයි. නිදසුනකට ෆ්‍රොයිඩ්ගේ විකාර මගහැරීම වගේ, එහෙත් සමහර ගැටුම් වල එක්තරා ගතිකත්වයක් නිසා ස්ත්‍රීවාදය එතැනදී ගැටුමෙම කොටස් කරුවෙක්. නිදසුනකට, මාක්ස්වාදය පුරුෂයින්ගේ ව්‍යාපාරයක් නිසා ස්ත්‍රී සිතුවිලි කිහිපයක් ඒකත් එක්ක ගැටුනා. ස්ත්‍රීවාදයට මාක්ස්වාදය උවමනා නැති බවත් ප්‍රකාශ වුණා. ඊළඟට ඒ ස්ත්‍රී සිතුවිලි ටිකම



ප්‍රාග්ධනයයි මර්ධක රාජ්‍යයයි එක්ක ගැටෙන කොට වටහා ගත්තා මේ නිශ්චිත ක්ෂේත්‍රයේ මාක්ස්වාදයේ තියෙන ප්‍රබලකමයි, සංයුක්තතාවයයි. ඉතිං, නොනවතින ගැටුම්. ලේ මස් අස්සේ පවා "මෙවැනි" ගැටුම් පවතිනවා. නිදසුනකට ද්විලිංගික ගැහැණු ශරීර පුරුෂ විරෝධයක් මතු කරනවා වගේ. ඉතිං, බහුතර ස්ත්‍රී සිතුවිලි කොහේ හෝ තැනකදී මේ වගේ "භෞතික" ගැටළු වලට මුහුණ දුන්නම එතන ඉතිහාසය වෙලා තියෙන්නේ- සම්ප්‍රදාය වෙලා තියෙන්නේ පුරුෂ සමාජ විද්‍යාව.

පවතින සමාජ විද්‍යාවත් එක්ක ගැහැණු ශරීරය ආවේනිකවම පාරභෞතිකවාදී වුනත් ස්ත්‍රීවාදයට පවතින්න වෙලා තියෙන්නේ සංසර්ග කේන්ද්‍රීය සමාජ විද්‍යාවත් එක්කමයි. මේ වනාහි රේඛීය ප්‍රතිවිරුද්ධතාවයක් නෙමෙයි; මේ වනාහි එකිනෙකා ස්ව විනාශී ප්‍රතිවිරෝධයක්. මෙන්න මෙතැන චූටිම චූටි උපායක් තමයි ස්ත්‍රීවාදය වාසනාව කරවලා පාරභෞතිකවාදය පවක් කරවන එක. "දියුණු" පුරුෂ ශරීරවලට ස්ත්‍රීවාදය සංජානනය නොවන එක තැනක් මේ. මෙවැනි පුරුෂ ශරීරවලට ස්ත්‍රීවාදය කියන්නේ තමන්ගේ දේශපාලන උපායක් ; තමන්ගේ අභ්‍යන්තර ආවේගවලදී ස්ත්‍රීවාදය කියන්නේ චන්ඩි බොරුවකට. කොහොම හරි මේක ගැහැණු ශරීරවලට ගැටළුවක් නෙමෙයි. ගැටළුව වෙන්නේ අර උපාය ගැහැණු ශරීර වලින් නිකුත් වෙන්නේ දේශපාලනිකව නොවේ වීමය: ඒ උපාය පවා වර්තමාන ගැහැණු ශරීරයේ අභ්‍යන්තර ආවේගවලින්ම මතුවන්නක්. ඉතිං, පවතින ස්ත්‍රීවාදයට බහුතරයක් පුරුෂ ශරීර දැනුවත්ව බොරු කරනවා. බහුතරයක් ගැහැණු ශරීර නොදැනුවත්ව බොරු කරනවා.

## ස්ත්‍රීවාදය ආවේණිකවම පැරණි සමාජයට අයිතියි ; අවශ්‍ය වෙන්නේ පුරුෂවාදයක්

අන්තිම කුහක සන්දර්භයක පුරුෂවාදයක් ගැන ඉඟි මීට කලින් මතුවෙලා නැතුව නෙවෙයි. පුරුෂයින්ගේ ලිංගික පීඩනය, ස්ත්‍රී ආධිපත්‍යය වගේ බෙරිහන්දීම් මේ තුල බහුලයි. "සුල්තාන්වරුන්ගේ සමාජ විද්‍යාවක්" වුණු මේ ගැන කථා කිරීම අපේ කොටස නෙමෙයි.

පැවතුණු සමාජයේ, සංසර්ග කේන්ද්‍රීය වීම සමාජ විද්‍යාවේ විෂය ක්ෂෙත්‍රය වීම, නමැති මැදිහත්වීම ගැන කල්පනාකාරී වුනාම මතුවන්නේ අළුත්ම තත්වයන් ටිකක්. "සමාජයේ" පුංචිම භාවිතයක් වුණු සංසර්ගය විශාල කිරීම කියන්නේ "සමාජයේ" පුංචි කමක් නෙවෙයි; එක්තරා භාවිතයක පුංචි කමක්. එහෙම පුංචි භාවිතයක ප්‍රධාන ඉලක්කය "ගැහැණු ශරීරය" වුණාම ආයෙමත් "පුංචි" ගැහැණු ශරීරය නෙවෙයි; අර භාවිතයමයි. ඉතිං, මේවා මහදවල් වගේ හඳුනගන්න තියෙන පොට අපි පටලවගෙන. පුංචි වුණු පුරුෂ මූලික නිර්මිතයන් "සමාජය" තරම් විශාල කරන්න නෙමෙයි අපි දඟලන්න ඕනේ. විශාල වුණු ගැහැණු අවකාශය ස්ත්‍රීවාදය තරම් පුංචි කරන්න නෙමෙයි අපි දඟලන්න ඕනේ. මේ වනාහි පැවතුණු කුණු ගොඩේ තෝන් ලණුව අපට දැම්මක්. අපි කරන්න ඕනේ දේවල් අනික් පැත්තට හරවන එකයි.

ඇයි, විශාල සමාජයේ විශාල ගැහැණු අවකාශයේ පුංචිම පුංචි පුරුෂ භාවිතය කොටු කරන්න අපට බැරි වුණේ. (පැහැදිලිවම පුංචි භාවිතය තුල මුළු සමාජය ම හිටිය නිසයි) ඇයි අපි ජීවිතය තරම් සරල, ආධුනික, බොළඳ දර්ශනවාදයේ දැඩිකම්

ටික, සනීභවනය වුණු දේවල් ටික කොටු නොකළේ. ඇයි, අනෙකාව හඳුනාගන්න මේ තරම් උපකාරීවෙන අනෙකා වෙනුවෙන් අපව පොළඹවන සමාජ විද්‍යාවෙන් සංසර්ගය පන්නලා නොදැම්මේ.

මේ අරුතින්, පුරුෂවාදය සූත්‍රගත කලාම අළුත් ආරම්භයක මුළු යතුරු කැරැල්ලම අපි අතට එනවා. ඉතිං, අළුත්ම පිස්සන් කොටුවේ සටන් පාඨය අපට මෙහෙම ගොතු කරන්න පුළුවන්; අපට ඕනේ පැවතුන සමාජයේ (ස්ත්‍රීවාදය නමැති සහන් එළිය තිබුණු සමාජයේ) ඩෙරීඩාව ස්ථාපිත කරන්න නෙමෙයි; අළුතින් නිර්මාණය කරන පුරුෂවාදය (පැවතුන නමුත් රීතිගත නොවුන වැසිකිළිය) තුල ඩෙරීඩාව ස්ථාපිත කරන්නයි. ඒ නිසා ඩෙරීඩාගේ අවාසනාව ටිකක් දැඩි එකක්; කෙරෙන්න යන ක්‍රියාව විසංයෝජනය නෙමෙයි කියන්නත් බැහැ - ඒ විසංයෝජනයෙන් කාටවත් ඇති ජොලියකුත් නැහැ.